වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2021



වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
முதியோர்களுக்கான தேசிய சபை
National Council for Elders

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சு.

State Ministry Of Primary Health Care, Epidemice and Covid Disease Control.

පටුන

පටුන.....1

පූර්විකාව.....2

විධායක වාර්තාව.....3

හැඳින්වීම.....4

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය.....5

දැක්ම.....5

මෙහෙවර.....5

සංවිධාන සැලැස්ම 2021.....6

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව 2021.....7

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වර්තාව 2021.....8

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වාර්තාව 2021.....9

2021 වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය 15

ස්වයං රැකියාවල නිරත වැඩිහිටියන් සඳහා ආධාර ලබාදීම 2021.....15

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම 2021.....16

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන.....17

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු 2021.....19

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.....20

2021 දෙසැම්බර් 31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය.....22

2021 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය.....24

2021 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.....25

2021 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....26

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.....27

විගණකාධිපතිගේ වාර්තාව.....39

විගණකාධිපතිගේ වාර්තාව සම්බන්ධ පිළිතුරු.....49

පුර්විකාව

ශ්‍රී ලාංකීක වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා අභිමානය සහතික කරමින් වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරලීම වෙනුවෙන්, 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ 2011 අංක 5 දරණ සංශෝධිත පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත බලය පවරා ඇත.

වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය, ආත්මාභිමානය, ස්වාධීනත්වය,සහභාගීත්වය,රැකවරණය, හා ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම උදෙසා වැඩසටහන් රාශියක් වාඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රමුඛ කාර්යභාර්ය වේ.

2021 වර්ෂයේ ශ්‍රී ලාංකේය වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය,අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කිරීම 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ අරමුණයි.

විධායක වාර්තාව

2021 වර්ෂයේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කර වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය උදෙසා කැපවී ක්‍රියා කලත් එම කාලවකවානුව තුළ රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අපේක්ෂා කරන ලද අරමුණු හා ප්‍රගතිය කරා ලඟා විමට නොහැකි විය.ඒ අනුව 2021 වර්ෂයේ සැලකිය යුතු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගත නොහැකි විය.

වත්මන් රජයේ “සෞභාග්‍ය දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ අවුරුදු 70ට වැඩි වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් රුපියල් දෙදහසක මහජන ජීවනාධාර ලබා දීම ප්‍රධාන වූ අතර පැවති අභියෝග ජයගැනීමට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ගරු අමාත්‍යතුමියගේ සහ අමාත්‍ය කාර්යය මණ්ඩලය මේ පිළිබඳව දක්වන ලද උනන්දුව ද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලය ද, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය ද, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන නිලධාරී පිරිසට ද විශේෂ ස්තූතිය හිමි විය යුතුය.

හැඳින්වීම

පසුගිය දශක කිහිපය පුරා සිදු වූ සමාජ,ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන සෞඛ්‍යය,පෝෂණය හා අධ්‍යාපනය යනාදී අංශවල ක්‍රමික වර්ධනයක් දක්නට ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස මරණ හා උපත් අනුපාතය පහත වැටී ආපේක්ෂිත ආයු කාලය ඉහළ යාම සිදුවීමත් සමඟ මෙරට වැඩිහිටි ජනගහණයේ සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි.ඒ අනුව වර්තමානයේ 14.6% ට ආසන්න මට්ටමේ පවතින වැඩිහිටි ජනගහණය ඉදිරි දශකය තුළ දළ වශයෙන් 21% ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

වැඩිහිටි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සුභසාධන පහසුකම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරදීම කළ යුතුය.ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය කැපවීමෙන් ක්‍රියා කරයි.2021 වර්ෂයේදි වැඩිහිටි ප්‍රජාව සවිබලගැන්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය.ග්‍රාමීය වැඩිහිටි කමිටු,ප්‍රාදේශිය වැඩිහිටි බලමණ්ඩල හා දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල යනාදිය සවිබල ගැන්වීම,අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙනුවෙන් රු.2,000/-වැඩිහිටි දීමනාව ගෙවීමේ කටයුතු හා අවුරුදු 100 සපිරි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු.5,000/- සියවස් සපිරි දීමනාව ගෙවීමේ කටයුතු සිදුකොට ඇත.තවද වෛද්‍ය සායන පැවැත්වීම,අක්ෂිකාච හා ශ්‍රවණ උපකරණ ලබා දීම,වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම,වැඩිහිටියන්ගේ සනීපාරක්ෂාව වැඩිකරලීම උදෙසා අවම පහසුකම් ලබාදීම යනාදි ව්‍යාපෘති වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ සිදුකොට ඇත.එමෙන්ම වැඩිහිටියන්ගේ මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වැඩිහිටි සත්කාරකයන් පුහුණු කිරීම වැනි දෑ ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනී.

එමඟින් වැඩිහිටියන් හුදකලාවීම වළක්වා ඔවුන්ගේ සමාජ සහභාගීත්වය වර්ධනය කිරීමත්,කායික,මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇති කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් රැකදීම අපගේ අභිප්‍රාය වේ.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිතම් ආරක්ෂා කිරීමේ
පනත යටතේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.


දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුලින් ක්‍රියාකාරී, ජවසම්පන්න හා
ඵලදායි වැඩිහිටි දිවියක් උදාකිරීම.


මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය හා
අභිමානය සහතික කිරීමත්, සමාජ සංවර්ධන කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගිත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැකදීමත්
අපගේ මෙහෙවර වේ.

සංවිධාන සැලැස්ම - 2021



වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2021



නම	තනතුර
1. සුනේත්‍රා ගුණවර්ධන මිය	සභාපති
2. කේ.එම්. වත්සලා ප්‍රියදර්ශනී මිය	උප සභාපති
3. කේ.ජී.ලැනරොල් මහතා	ලේකම්
4. චන්දන රණවිර ආරච්චි මහතා	සාමාජික
5. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.දිසානායක මහතා	සාමාජික
6. වෛද්‍ය ශිරෝමී මාදුවගේ මිය	සාමාජික
7. මහාචාර්ය පූජ්‍ය කෝන්ගස්තැන්න ආනන්ද හිමි	සාමාජික
8. සමන්ත ලියනවඩුගේ මහතා	සාමාජික
9. ජී.වී.ඒ.ද.සිල්වා මහතා	සාමාජික
10. නීතිඥ ටී.එම්.ජේ.සුමේධ මහතා	සාමාජික
11. ලුතිනල් කර්නල් එස්.එම්.සී.සුනිල් සිරිවර්ධන මහතා	සාමාජික
12. වෛද්‍ය පද්මා ගුණරත්න මිය	සාමාජික
13. මහින්ද මඩිහේවා මහතා	සාමාජික
14. එන්.ටී. අමරතුංග මිය	සාමාජික
15. එච්.වජිර ශ්‍රී ස්වර්ණ බංඩාර මහත්මිය	සාමාජික
16. ඒ.ඩි.ආර්.ඒ.ඩබ්ලිව්.ඥාණසිරි මහතා	සාමාජික

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ වාර්තාව -2021

වර්තමානය වන විට වැඩිහිටි ජනගහනය වර්ධනය වීම සමාජ ගැටලුවක් වන තරමට වර්ධනය වී ඇත.දිනෙන් දින සීඝ්‍රයෙන් වැඩිහිටි ජනගහනය ඉහළ යමින් පැවතීම අනාගතයේ ගැටළුවක් නොවීම පිණිස වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා රැකවරණය උදෙසා සැලසුම් සම්පාදනය කිරීමේ ප්‍රධාන වගකීම අප අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

මෙම කර්තව්‍ය ඉටු කිරීම සඳහා "2011 අංක 05 දරණ පනතින් සංශෝධිත, 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් " ලැබී ඇති බලතල අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කරනු ලබයි.ඒ අනුව එම කාර්යයන් ඉටු කිරීමට පිහිටුවා ඇති ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් විවිධාකාර වැඩසටහන් රාශියක් සංවිධානය කරමින් ක්‍රියාත්මක කරන අතර,2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන “වැඩිහිටි සුභසාධනය සඳහා වන ජාතික අරමුදල" මඟින් ද වැඩිහිටි සුභසාධන සේවා වඩාත් පුළුල් අර්ථයකින් සාධනීය ප්‍රතිඵල අපේක්ෂාවෙන් දියත් කරන්නට යෙදුනි.

මෙම කාර්යභාරය ඉටු කිරීමෙහිලා ප්‍රධාන වගකීම දරණ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවත්,ජාතික වැඩිහිටි මහල්කම් කාර්යාලයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයත් කැපවීමෙන් කරන සේවය අගය කළ යුතු අතර සෙසු පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් තම කාලය හා ශ්‍රමය වැඩිහිටි ප්‍රජාවේ උන්නතිය වෙනුවෙන් කැපකරමින් කරනා මෙහෙවර අගය කරන අතර මාගේ කෘතඥතාව මේ සියලු දෙනා වෙත පුද කර සිටිමි.

එසේ වුවද මේ වනවිට ලංකාවේ මිලියන 3 කට අධික වැඩිහිටි ජනගහනයේ සුභසාධනය හා ආරක්ෂාව මෙවැනි ආයතනයකට සීමා කරමින් ඉටු කිරීම මහත් අභියෝගයක් මෙන් ම අසීරු කාර්යයක් වන හෙයින්,ආර්ථික ස්ථායිතාවක් සහිත පවුල මූලික කේන්ද්‍රස්ථානය වූ සමස්ත සමාජය විසින් සීඝ්‍රයෙන් ඉහළ යන වැඩිහිටි ජනගහනයේ සුභසාධනය හා ආරක්ෂාවට කැපවී වැඩිහිටියන් සඳහා සුරක්ෂිත හෙට දිනක් බිහි කිරීම වෙනුවෙන් කටයුතු කිරීමට කාලය එළඹ ඇති බව මාගේ හැඟීමයි.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව - 2021

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණය හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ අතකරගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ.මෙම වර්ෂය තුළ රටෙහි පැවති කොරෝනා (covid) වසංගතය හේතුවෙන් සැලකිය යුතු කාර්ය සාධනයක් අත්කර ගතහැකි විය.

ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා

- **වයස අවුරුදු 70ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා වූ රු2,000/- දීමනාව**

අභිමානවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ඔවුන් හට ගරුබුහුමනින් ඒ සඳහා අත්වැලක් සැපයීම හා වැඩිහිටි සුභසාධන වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් වයස අවුරුදු 70 ඉක්ම වූ වැඩිහිටියන් වෙනුවෙන් මාසිකව රුපියල් 2,000/-ක දීමනාවක් ගෙවීම වෙනුවෙන් 2021 වර්ෂය සඳහා රු.මි. 10,000ක ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිලාභී පුරවැසියන් 416,667කට ප්‍රතිලාභ ලබා දෙමින් රු.මි 9.868 ක මූල්‍ය ප්‍රගතියක් වර්ෂය තුළ ලබා ඇත.

- **වයස අවුරුදු 100ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා වූ රු 5,000/- දීමනාව**

වයස අවුරුදු 100 ඉක්ම වූ වැඩිහිටියන් රටක ඉතා වැදගත් කණ්ඩායමක් සේ සැලකිය හැකිය. අවුරුදු 100 ඉක්වූ වැඩිහිටියන් රටක සංවර්ධනය පිළඹිබු කරන, විශේෂයෙන්ම සෞඛ්‍ය සම්පන්න ජාතියක් සිටින රටක් ලෙස තහවුරු කිරීම සඳහා වන මිණුම් දණ්ඩක් ලෙසට සැලකිය හැකි අතර, එක් අතකින් එය රටක ජාතික අභිමානයට ද හේතු වන කරුණක් සේ සැලකිය හැකිය. ඒ අනුව වයස අවුරුදු 100 ඉක්ම වූ සියළුම වැඩිහිටියන් වෙනුවෙන් මාසිකව රුපියල් 5,000/-ක දීමනාවක් ගෙවීම වෙනුවෙන් 2021 වර්ෂය තුළ රු.මි. 30 ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර, ප්‍රතිලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 500කට දීමනාව ලබා දෙමින් රු.මි. 27.067ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත.

භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්

01. පුහුණු පර්යේෂණ හා දැනුවත් කිරීම.

"ළමා ලෝකයයි - වැඩිහිටි වියයි" වැඩිහිටියන් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන.මේ හරහා දරුවන් හා වැඩිහිටියන් අතර අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ 2021 වර්ෂය සඳහා රු.මි. 0.2 ප්‍රතිපාදන වෙන් කළ අතර මුලික කටයුතු සඳහා පමණක් රු.මි. 0.05 ක් වැය කොට ඇත.

02. වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම.

රජයේ විධිවිධාන වලට අනුකූලව සකස් කරන ලද ඉහළ ප්‍රමිතියකින් හා ගුණාත්මකභාවයකින් යුක්ත වූ හැඳුනුම්පතක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් ලබා දීම මේ මඟින් සිදු වේ. මේ සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 0.7 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වර්ෂය තුළ නව හැඳුනුම්පත් 43,364 ක් නිකුත් කරමින් රු.මි. 0.45 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

03. වැඩිහිටියන්ට වඩා හොඳ පහසුකම් සැපයීම සඳහා වැඩිහිටි නිවාස නඩත්තු කිරීම, ආධාර සැපයීම හා වැඩිහිටි නිවාස පරීක්ෂාව.

දිවයින පුරා පිහිටා ඇති 306 ක් පමණ වූ වැඩිහිටි නිවාසයන්හී රැකවරණය ලබන වැඩිහිටියන්ගේ තම සැඳෑ සමය ඉතා අර්ථවත්ව, සතුටින් සහ ආරක්ෂකාරීව ගතකිරීමට හැකිවෙනු වස් තම සේවාදායකයන් හට ගුණාත්මක, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සැපයීමට හැකිවන පරිදි දිවයිනේ සෑම වැඩිහිටි නිවාසයකම තත්වය උසස් කිරීම උදෙසා කරනු ලබන කුඩා පරිමාණයේ (පිරිවැය) අත්‍යාවශ්‍ය ඉල්ලීම් පදනම් කරගනිමින් එහි අලුත් වැඩියාවන්, උපකරණ ලබාදීම් සහ වෙනත් අත්‍යවශ්‍යතා සඳහා ආධාර උපකාර කිරීම මෙමඟින් සිදුකෙරේ.

එමෙන්ම ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන රජයේ හා පෞද්ගලික අංශයෙහි වැඩිහිටි නිවාස වල තත්වය, පවතින අක්‍රමිකතාවයන් ,නේවාසික වැඩිහිටියන්ට සපයන සේවාවන්, පිළිබඳව නිරතුරුව අධීක්ෂණය හා පරීක්ෂා කිරීම තුලින් නේවාසික වැඩිහිටියන්ට යහපත් හා ඵලදායී සේවාවක් සැලසීම මෙහි අරමුණයි. තවද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් පාලනය වන කතරගම රජයේ වැඩිහිටි නිවාසය සහ මාලිගාතැන්න ඒවිජින් නෝනා වැඩිහිටි නිවාසයේ පරිපාලන වියදම්, පුනරාවර්ථන වියදම් සහ අත්‍යාවශ්‍ය නඩත්තු වියදම් දැරීම මෙමඟින් සිදුකෙරේ.මේ සඳහා 2021 වර්ෂය වෙනුවෙන් රු.මි.1.34 ප්‍රතිපාදන වෙන් කොට රු.මි. 1.34ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

04. ප්‍රකාශන.

වැඩිහිටි දිනයට සමගාමීව ප්‍රචාරණ කටයුතු සිදු කිරීම,පුවත්පත් දැන්වීම් පළ කිරීම හා ‘‘සාර්ථක වැඩිහිටි දිවියට මඟ’’ පොත මුද්‍රණය කිරීම යනාදි මාධ්‍ය හා ප්‍රකාශන කටයුතු වෙනුවෙන් මෙම වර්ෂය තුළ රු.මි. 1.1 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2021 වර්ෂය සඳහා රු.මි. 0.93ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

05. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

මේ යටතේ එක් ප්‍රගති සමාලෝචන රැස්වීමක් ප්‍රධාන කාර්යාලයේ පැවති අතර අනෙකුත් වැඩසටහන් zoom තාක්ෂණය ඔස්සේ පවත්වා ඇත. මෙ සඳහා 2021 වර්ෂයේ වෙන්වී ඇති රු.මි. 0.2 න් රු.මි. 0.09ක මූල්‍ය ප්‍රගතියතක් අත් කරගෙන ඇත.

06. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව.

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවා ඇත. 2021 වර්ෂය තුළ සභාවාර 09ක් පවත්වා ඇති අතර මේ සඳහා වර්ෂය තුළ රු.මි. 1.68ක වෙන් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු.මි. 1.2 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

07. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.

2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 9 දරණ වැඩිහිටි තැනැත්තන් ආරක්ෂා කිරීමේ පනතේ 24 වගන්තිය මඟින් ස්ථාපනය කර ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය සාමාජිකයින් 5 කින් සැදුම් ලත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන අධිකරණමය බලය සහිත ආයතනයක් වේ.එහි සභාපතිත්වය විශ්‍රාමික මහාධිකරන විනිසුරුවරයෙකු විසින් දරනු ලබයි. වර්ෂය තුළ මණ්ඩලය රැස්වීම් වාර 13ක් පවත්වා ඇත.මේ සඳහා රු.මි. 1.3 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර රු.මි. 0.92ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

08. රු.2,000/- වැඩිහිටි දීමනාව සම්බන්ධව පරිපාලන වියදම .

වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ලබා දෙන වැඩිහිටි දීමනාවට අදාලව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ රාජකාරී කටයුතු වෙනුවෙන් අවශ්‍ය ලිපි ද්‍රව්‍ය දීමනා සහ වැඩිහිටි දීමනාවට අදාල සහතිකපත්, ලෙජර් මුද්‍රණය වෙනුවෙන් මුදල් ලබා දීම මේ යටතේ සිදු කරන ලදී.ඒ අනුව 2021 වර්ෂය සඳහා රු.මි.6.42 ක ප්‍රතිපාදන වෙන් කර ඉන් රු.මි. 6.34ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

***09.*වෙනත් වියදම්.**

වැඩිහිටි සුභසාධනය වෙනුවෙන් වූ වැඩසටහන් සංවිධානය කිරීම වෙනුවෙන් 2021 වර්ෂය සඳහා රු.මි.0.3 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉන් රු.මි.0.04 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

10. වැඩිහිටි ස්වයං රැකියා ආධාර ලබා දීම.

ස්වයං නිර්මාණශීලි හැකියාවන් හා අත්දැකීම් පදනම් කරගනිමින් වැඩිහිටි පුරවැසියන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා රු. 30,000/ ක උපරිමයකට යටත්ව ස්වයං රැකියා ආධාර ලබා දීම සිදු කරනු ලැබීය. ඒ අනුව 2021 වර්ෂයේ රු.මි.2.75 ක වෙන් වූ ප්‍රතිපාදනයන්ගෙන් වැඩිහිටි ස්වයං රැකියාලාභීන් 95 දෙනෙකු වෙත මූල්‍ය අනුග්‍රහකත්වය ලබා දෙමින් රු.මි.2.74ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

11. විගණන හා කළමනාකරණ කමිටු.

2021 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පවත්වා ඇති අතර මේ සඳහා අනුමත රු.මි. 0.16 ක ප්‍රතිපාදනයන්ගෙන් රු.මි. 0.09ක මූල්‍ය වියදමක් වාර්තා කොට ඇත.

12. සුව සහන සෞඛ්‍ය වැඩසටහන

නිවාසගත වැඩිහිටියන් සඳහා ශල්‍යාධාර වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහන යටතේ වැඩිහිටි රෝගීන්ට අවශ්‍ය ඖෂධ,අතිරේක ආහාර පාන,ප්‍රවාහන පහසුකම් ලබා දීම සඳහා 2021 වර්ෂයෙදී රු.මි.0.1 වෙන් වූ අතර ඉන් රු.මි.0.03ක මූල්‍ය වියදමක් දරමින් එක් ප්‍රතිලාභියකු වෙනුවෙන් ආධාර ලබාදීම සිදුකොට ඇත.

13. ක්ෂේත්‍ර පරීක්ෂාව.

වැඩිහිටි සුභසාධක වැඩසටහන්වල ගුණාත්මක හා ඵලදායීතාව වර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහන්වල කාර්යඵල හා වැඩිහිටි නිවාස පරීක්ෂා කිරීමේ කටයුතු මෙමඟින් සිදුකොට ඇත.2021 වර්ෂයේදී රු.මි.0.4ක මුදලක් වෙන් කළ අතර,රු.මි.0.35ක මූල්‍ය වියදමක් දරා ඇත.

<u>සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන්.</u>

01. වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීම,ලියාපදිංචි කිරීම සහ දැනට පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයන්ගේ නව ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් වෙනුවෙන් සිදු කර ඇති ඉල්ලීම් අනුව ප්‍රතිපාදන ලබාදීම.

සෑම වැඩිහිටි නිවාසයක්ම ශ්‍රී ලංකා ප්‍රමිති 1506:2015 / වැඩිහිටි උවටැන් නිවාස සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අනුකූල වන පරිද්දෙන් ප්‍රමිතිගත කිරීම හා ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යන වැඩිහිටි නිවාස 04 ක් වෙනුවෙන් නිවාස අළුත්වැඩියාව හා උපකරණ ලබා දීම වෙනුවෙන් රු.මි.02 ක මුදලක් ලබාදීම සඳහා සැලසුම් කර ඇත.

මෙහි දී එක් වැඩිහිටි නිවාසයක් වෙනුවෙන් රුපියල් මිලියන දෙකක උපරිමයකට යටත්ව අරමුදල් ලබාදීම සිදුකරයි. ඉහත ප්‍රමිතියට අදාලව සෑම වැඩිහිටි නිවාසයක් ම ඉදිරියට පවත්වාගෙන යාම වෙනුවෙන් අවශ්‍ය භෞතික සම්පත් ගොඩනැගීම සඳහා මෙම මුදල් යොමු කෙරේ. ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා අදාල බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන වැඩිහිටි නිවාස ප්‍රමිතිගත කිරීමට අදාලව ඉල්ලුම්පත් කැඳවන අතර ඊට අදාල සුදුසුකම් සහ කොන්දේසි සපුරා ඇති තොරාගත් වැඩිහිටි නිවාස වෙනුවෙන් මුදල් ලබා දීම (මුදල් ලබාදීමේ කොන්දේසි ඇතුළත්ව) සිදුකරනු ලබයි. මේ සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 10.00 ක් වෙන් වූ අතර, වර්ෂය තුළ රු.මි. 7.60 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

02. ශ්‍රවණ උපකරණ ලබා දීම.

ශ්‍රවණ ආබාධයන්ගෙන් පෙළෙන වැඩිහිටියන් උදෙසා ශ්‍රවණ උපකරණ ලබා දීම මෙහිදී සිදුකරන ලදී. මේ සඳහා 2021 වර්ෂය තුළ රු.මි. 13.5 වෙන් කර ඇති අතර ඉන් රු.මි. 11.22 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.මෙම වර්ෂය තුළ ශ්‍රවණ උපකරණ 419 ක් ලබා දී ඇත.

03. වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා ආධාර ලබා දීම.

වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ (මේස,කබඩ් ඇතුළු අනෙකුත්), අළුත් වැඩියා කටයුතු හා නව ඉදිකිරීම් සඳහා (උපරිම රු.මි. 0.5කට යටත්ව) ඉල්ලීම් අනුව ආධාර ලබා දීම මෙහිදී සිදුකරනු ලැබීය.මේ සඳහා වර්ෂය තුළ රු.මි. 20.00 ක ප්‍රතිපාදන වෙන් කළ අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාල 42ක වැඩිහිටි දිවා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට ආධාර ලබාදෙමින් රු.මි 18.84 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

04. ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබල ගැන්වීම.

ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම යටතේ වැඩිහිටි කමිටු ශක්තිමත් කිරීම වෙනුවෙන් ඒ සඳහා අවශ්‍ය උපකරණ හා අවශ්‍ය භාණ්ඩ ආදිය ලබා ගැනීම වෙනුවෙන් ග්‍රාමීය කමිටු වෙත (රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව) මූල්‍ය අනුග්‍රහය ලබා දීම මේ යතේ සිදුවේ.ඒ අනුව 2021 වර්ෂයේ කමිටු 303 ක් වෙත අවශ්‍ය උපකරණ ලබා ගැනීම සඳහා අරමුදල් ලබා දී ඇත.2021 වර්ෂය සඳහා මේ වෙනුවෙන් රු.මි. 20.00 ක් වෙන් වී ඇති අතර රු.මි. 15.66 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත

05. වැඩිහිටියන් තම නිවස තුල ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීම.

වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් ජීවත්වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය (කොමඩ්,ඇඳ,මෙට්ට,අත්වැට,හා නිවසේ අළුත් වැඩියාවන්) සැපයීම වෙනුවෙන් ඉල්ලීම් අනුව එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙනුවෙන් රු.මි. 0.3 ක උපරිමයකට යටත්ව ප්‍රාදේශී ලේකම් කාර්යාල

211 ක පුද්ගලයින් 2441 කට ආසන්න පිරිසකට අරමුදල් ලබා දීම සිදුකර ඇත.2021 වර්ෂය වෙනුවෙන් රු.මි. 75.00 ක වෙන්වී ඇති ප්‍රතිපාදනයන්ගෙන් රු.මි 70.26 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

06. දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

දිස්ත්‍රික් මට්ටමින් වැඩිහිටි විෂය ආවරණය කරනු ලබන නිළධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම වෙනුවෙන් වර්ෂයකට එක් වරක් ඉල්ලීම් අනුව රු.50,000/ බැගින් ලබා දීම සිදු කරයි.2021 වර්ෂය සඳහා දිස්ත්‍රික් 25 තුළ රැස්වීම් වාර 25 ක් පවත්වා ඇති අතර,මේ සඳහා වර්ෂය තුළ රු.මි. 1.25ක ප්‍රතිපාදන වෙන් කර රු.මි. 0.26ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වී ඇත.

07. පරිපාලන වියදම්.

සමාජ ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක වැඩිහිටි සුභසාධන වැඩසටහන් සඳහා වූ පරිපාලනමය වියදම් මෙමඟින් දරා ඇත.මේ සඳහා 2021 වර්ෂය වෙනුවෙන් රු.මි. 0.5 ක් වෙන් වූ අතර රු.මි.0.34 ක් වියදමක් මෙමඟින් දරා ඇත.

08. පන්නල වෙල්කම් වැඩිහිටි නිවාසය නඩත්තු කටයුතු.

පන්නල වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසයේ දෛනික කටයුතු සහ සෙසු කටයුතු වෙනුවෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් 2021 වර්ෂය සඳහා රු.මි. 8.00ක ප්‍රතිපාදන වෙන් කළ අතර රු.මි. 5.5ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

09. කතරගම නව වැඩිහිටි නිවාසය ඉදිකිරීම.

කතරගම නව වැඩිහිටි නිවාසයේ ඉදිකිරීම් කටයුතු සඳහා වර්ෂය තුළ රු.මි. 70.13 ක මූල්‍ය වියදමක් දරා ඇති අතර, 2021වර්ෂයේ දී මේ සඳහා රු.මි.70.00 ක් වෙන් කරන ලදී.

10.ආරෝග්‍යා සෞඛ්‍ය වැඩසටහන.

2020 වර්ෂයේ ආරම්භ වූ මෙම වැඩසටහන යටතේ පිළිකා,වකුගඩු,අංශභාගය යනාදි රෝග සඳහා එක් අයෙකුට එක් වතාවක් පමණක් ලබාදෙන රුපියල් 25,000/- ක මූල්‍ය ආධාරයක් ලබාදෙනු ලබයි.වයස අවුරුදු 60 සම්පූර්ණ වී තිබීම අනිවාර්ය වන අතර වෛද්‍ය පරීක්ෂණ ,ඖෂධ මිලදී ගැනීම ,ප්‍රවාහන පහසුකම් සැපයීම යනාදිය සඳහා මෙම ආධාරය පිරිනමනු ලබයි.2021 වර්ෂයේ දී පුද්ගලයන් 395 දෙනෙකුට ආධාර ලබා දෙමින් රු.මි. 9.93 ක මූල්‍ය ප්‍රගතියක් ලබාගත් අතර මේ සඳහා රු.මි. 10.00 ක මුදලක් වෙන් විය.

11.සියවස් පුර්ණ දීමනා පොරොත්තු ලේඛන ගෙවීම් කටයුතු.

වයස අවුරුදු 100 ඉක්ම වූ පොරොත්තු ලේඛනගත පුද්ගලයින් 30 දෙනෙකු සඳහා මාස 05 ක් (අගෝස්තු - දෙසැම්බර්) දක්වා ගෙවීම් කටයුතු මෙමඟින් සිදු කොට ඇත.2021 වර්ෂයේ මේ සඳහා රු.මි.0.75 මුදලක් වෙන් කළ අතර,රු.මි.0.35 ක මූල්‍ය ප්‍රගතියක් ලභා කරගෙන ඇත.

12.මහජනයා දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සිදු කරගෙන යන ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය වැඩසටහන් හා දැන්වීම් පළකිරීම මේ යටතේ සිදුකොට ඇත.2021 වර්ෂය සඳහා රු.මි.01 ක මුදලක් වෙන්කළ අතර එයින් රු.මි.0.84 ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

13.ගම්පහ මාරගහලන්ද ඉඩම සංවර්ධනය.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට අයත් ගම්පහ මාරගහලන්ද ඉඩම ආරක්ෂා කිරීම වෙනුවෙන් වැට හා ගේට්ටුව ඉදිකොට සංවර්ධනය කිරීම සඳහා 2021 වර්ෂයේ රු.මි.0.56ක මුදලක් වෙන් වූ අතර රු.මි.0.56ක මූල්‍ය වියදමක් මෙමඟින් දරා ඇත.

14.දිරිය පියස නිවාස යෝජනා ක්‍රමය.

සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම් පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියාව (එක් නිවාසයක් සඳහා රු.මි.0.3 බැගින්) වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.මි.15.00 වෙන් කර ඇති අතර ඉන් රු.මි.13.8ක මුල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

15.වැඩිහිටි නිවාස සඳහා ආධාර ලබාදීම.

කොරෝනා වසංගතය හමුවේ නිවාසගත වැඩිහිටියන් සුරක්ෂිත කිරීම සඳහා නිවාසගත වැඩිහිටියන් හට අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම මේ යටතේ සිදුකොට ඇත.මෙ සඳහා 2021 වර්ෂයේ දී රු.මි.01 ක මුදලක් වෙන් කළ අතර එයින් රු.මි.0.98ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

16.දිවියට සවියක් ව්‍යාපෘති යෝජනා ක්‍රමය.

ඇවිදීමේ ආබාධ සහිත වැඩිහිටියන් හට ඇවිදීමට මඟක් විවර කරදීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කරනු ලබයි.මේ යටතේ ආබාධිත වැඩිහිටියන් වෙනුවෙන් අත්වාරු,වෝකර්,රෝද පුටු,කොමඩ්, හා කිහිළිකරු ලබාදීම සිදු කරයි.ඒ අනුව 2021 වර්ෂයේ දී රු.මි.10.00ක් වෙන් වූ අතර එයින් රු.මි.10.04ක මූල්‍ය ප්‍රගතියක් අත් කරගෙන ඇත.

කේ.ජී ලැනරෝල්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2021- වර්ෂයේ සංවර්ධන කාර්ය සාධනය.

ස්වයං රැකියාවල නිරත වැඩිහිටියන් සඳහා ආධාර ලබා දීම - 2021

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
බස්නාහිර	කළුතර	07
	කොළඹ	02
	ගම්පහ	14
මධ්‍යම	මාතලේ	04
	මහනුවර	08
	නුවරඑළිය	-
දකුණ	ගාල්ල	06
	මාතර	03
	හම්බන්තොට	02
නැගෙනහිර	මඩකලපුව	04
	අම්පාර	01
	ත්‍රිකුණාමලය	03
වයඹ	කුරුණෑගල	14
	පුත්තලම	04
උතුරු මැද	අනුරාධපුරය	06
	පොළොන්නරුව	02
ඌව	බදුල්ල	-
	මොණරාගල	-
සබරගමුව	රත්නපුර	11
	කෑගල්ල	02
උතුර	මන්නාරම	-
	මුලතිව්	-
	වවුනියාව	-
	යාපනය	02
	කිලිනොච්චි	-
එකතුව		**95**

වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම - 2021

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
බස්නාහිර	කළුතර	1994
	කොළඹ	3662
	ගම්පහ	2983
මධ්‍යම	මාතලේ	997
	මහනුවර	1934
	නුවරඑළිය	3299
දකුණ	ගාල්ල	2672
	මාතර	2106
	හම්බන්තොට	684
නැගෙනහිර	මඩකලපුව	806
	අම්පාර	661
	ත්‍රිකුණාමලය	4365
වයඹ	කුරුණෑගල	2981
	පුත්තලම	1071
උතුරු මැද	අනුරාධපුරය	1859
	පොළොන්නරුව	763
ඌව	බදුල්ල	1062
	මොණරාගල	1489
සබරගමුව	රත්නපුර	2360
	කෑගල්ල	3106
උතුර	මන්නාරම	442
	මුලතිව්	142
	වවුනියාව	257
	යාපනය	352
	කිලිනොච්චි	171
එකතුව		**42,218**
ප්‍රධාන කාර්යාලයෙන් ජංගම සේවාවලදි නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව		1146
නිකුත් කළ මුළු හැඳුනුම්පත් ගණන		**43,364**

වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ යෝජනාවක් පරිදි ඉතාමත් අසරණ දිළිඳු තත්වයේ පසුවන අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට පිළිසරණක් වීම අරමුණු කොට ගෙන මෙම වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ආරම්භ කර ඇත.

මෙම වැඩසටහන සඳහා ඕනෑම අයෙකුට මුදල් පරිත්‍යාග කළ හැකි වන අතර,එසේ පරිත්‍යාගශීලීන් විසින් ලබා දෙන මුදල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගන්නා ලද ඉතාමත් දිළිඳු අසරණ වැඩිහිටියන් වෙනුවෙන් මසකට රුපියල් 250 /- ක මුදලක් හෝ මසකට රුපියල් 500/- බැගින් මුදල් ආධාර ලබාදීමට කටයුතු කර තිබේ.ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබාදීමේ දී මාස 4කට වරක් එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.1000/- ක මුදලක් හෝ රු.2,000/- බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් ලබාදීම සිදු කරන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රතිලාභියා වෙත මුදල් ලබා දීම සිදු කරනු ඇත.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිටින අපගේ නිලධාරියෙකු (වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සමාජ සේවා නිලධාරී/සංවර්ධන නිලධාරී) සෑම තුන් මසකට වරක් මෙම ප්‍රතිලාභීන් පිළිබඳව තොරතුරු සොයා බලනු ලබන අතර ප්‍රතිලාභීන්ට මුදල් ලබා දෙන සෑම අවස්ථාවකම පරිත්‍යාගශීලීන්ව දැනුවත් කරනු ලබයි.

එසේම මෙම වැඩසටහන යටතේ ආධාර ලබාදීමේදී තමන් කැමති අයෙකු හෝ කීප දෙනෙකු තෝරා ගැනීමට හෝ තමන් කැමති ප්‍රදේශයක අයෙකු හෝ කිහිප දෙනෙකු නම් කිරීමට පරිත්‍යාගශීලියාට ද හැකියාව ඇත.එසේ නොමැති නම් එම තෝරාගැනීම මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලබන අතර,ප්‍රතිලාභියාගේ නම,ලිපිනය ඇතුලත් තොරතුරු පරිත්‍යාගශීලියා වෙත ලබාදීමට අප කාර්යාලයෙන් කටයුතු කරනු ඇත.

මෙම වැඩසටහන සඳහා දායකත්වය ලබාදීම සඳහා කැමති අයකු වේ නම් බත්තරමුල්ල ලංකා බැංකුවේ අංක 228075 දරණ “වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය සඳහා වන ජාතික අරමුදල” යන ගිණුමට ඔබගේ පරිත්‍යාග මුදල් ලබාදිය හැකි අතර,එසේ මුදල් තැන්පත් කිරීමේදී මුදල් තැන්පත් කළ ලදුපතේ පිටපතක් අප වෙත ලබාදිය යුතුය.එසේත් නොමැති නම්,අප කාර්යාලයට පැමිණ ඔබගේ මුදල් පරිත්‍යාග ලබාදිය හැක.

මෙය අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු පුණ්‍ය කටයුත්තක් වන බැවින් එය තවදුරටත් ව්‍යාප්ත කරමින් වැඩිහිටියන් විශාල පිරිසකට මෙම වැඩසටහනින් සේවයක් සැලසීමට අදහස් කර තිබේ.

ඒ අනුව 2021 වර්ෂයේදී වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහනේ පරිත්‍යාගශීලීන්,ප්‍රතිලාභීන් හා අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ පහත සඳහන් කර ඇත.

අනු අංකය	දායකයාගේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ප්‍රතිලාභියාගේ නම	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
01	ඩබ්.එම්.වත්සලා මිය	01	එම්.ජී වයලට්	තඹුත්තේගම
02	ගිණුම	01	ඩබ්.ජී.ගුණවතී	කුණ්ඩසාලය
03		01	බී.ඩී ජේන් නෝනා	රිදීගම
04		01	ඩී.එම් ඩිංගිරි අම්මා	මාස්පොත
05		02	ඉදුරගේ නන්දතිලක	මිනුවන්ගොඩ
06			එම්.කේ.ඒ සෝමා ගුණවර්ධන	මිනුවන්ගොඩ
07		01	එම්.නෝබට් විමලරත්න	කැස්බෑව
08		01	අයි.ඇන්සි නෝනා	කැළණිය
09		01	ඊ.පියසිලි	කඩුවෙල
10		03	ඒ.හේමපාල පෙරේරා	මහරගම
11			ලීලාවතී වීරසිංහ	මහරගම
12			එම්.ඒ.හේමලතා පෙරේරා	මහරගම
13		01	එච්.එම්.හේරත් මැණිකේ	ඉබ්බාගමුව
14		01	ජේ.පී.ලැයිසා	වරකාපොල
15		01	වර්ණපුලිගේ නන්දදාස	සීතාවක
16		01	පස්වැන්නගේ ප්‍රිතිලතා	සීතාවක
17		01	එච්.කුසුම් පෙරේරා	සීතාවක
18		01	ඊ.ජී ඩිංගිරි බණ්ඩා	දෙල්තොට
19		01	ඒ.ජී දයාවතී	කෝට්ටේ
එකතුව		19		

කතරගම සංචාරක නිකේතනයේ ආදායම් හා වියදම් තොරතුරු - 2021

මාසය	කාමර වෙන් කළ ප්‍රමාණය	ආදායම රු.	වියදම්	
			ජල බිල්පත් රු.	විදුලි බිල්පත් රු.
ජනවාරි	-	-	3,129.91	2,399.40
පෙබරවාරි	-	-	3,920.71	3,113.00
මාර්තු	03	3,875.00	3,516.30	2,088.00
අප්‍රේල්	-	-	7,403.05	1,996.80
මැයි	-	-	12,757.29	3,076.00
ජුනි	-	-	3,811.90	1,649.00
ජුලි	-	-	3,811.90	2,033.40
අගෝස්තු	-	-	4,309.91	2,253.00
සැප්තැම්බර්	-	-	7,478.29	789.00
ඔක්තෝබර්	-	-	4,274.44	1,832.10
නොවැම්බර්	-	-	6,750.00	1,996.80
දෙසැම්බර්	-	-	6,601.37	862.20
එකතුව	**03**	**3,875.00**	**67,765.07**	**24,088.70**

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය.

2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් පිහිටුවා ඇති වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සභාපති සහ සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ.වර්තමානයේ මෙහි සභාපති වනුයේ විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකි.

මෙහි කාර්යභාරය වන්නේ දරුවන් විසින් නොසලකා හැර ඇති,වයස අවුරුදු 60 ඉක්මවූ,වියපත් දෙමාපියන්ට එම නොසලකා හැර ඇති දරුවන්ගෙන් ජීවත්වීම සඳහා යම් නඩත්තු මුදලක් ලබා දීමය.ඒ අනුව මෙම දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන්ගෙන් මණ්ඩලය වෙත පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවකදී,මණ්ඩලය විසින් වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුකූලව අදාල පැමිණිලිකරු හා වගඋත්තරකරු යන අය කැඳවා කරුණු විමසා පරීක්ෂණයක් සිදු කොට දෙමාපියන්ගේ මාසික යැපීමට ප්‍රමාණවත් වන නඩත්තු මුදලක් නියම කිරීම සිදු කරනු ලබයි.එලෙස තීරණය කිරීමේදී දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේද ආදායම්,යැපීම් අවශ්‍යතා ආදි සියලු සාධක සැලකිල්ලට ගැනීම සිදු කරනු ලබයි.

මෙහිදී දෙමාපියන් තම දරුවන්ගෙන් මෙන්ම තමන් විසින් දරුකමට හදා ගන්නා ලද දරුවන්ගෙන්ද (Adoped child) නඩත්තු ඉල්ලීමට හැකියාවක් ඇත.තවද යම් දෙමාපියෙකුගේ වයස අවුරුදු 60 නොඉක්මවනු ලැබුවද ඔහු/ඇය තම එදිනෙදා නඩත්තු සපයා ගැනීමට නොහැකි නිසා ශාරීරික හෝ මානසික ආබාධයකින් පෙලෙන්නේ නම් මෙම පනතේ 24(1) වගන්තිය යටතේ නඩත්තු ඉල්ලා සිටීමේ හැකියාව පවතී.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන ඉල්ලුම්පත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීමේ පහසුකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සපයා ඇත.

නමුත්,මෙම මණ්ඩලයට පවුල් ආරවුල් මෙන්ම ඉඩකඩම් හෝ දේපල සම්බන්ධයෙන් පවුල් අතර පවත්නා ගැටලු විසඳීමට පනත යටතේ නෛතික බලයක් නැත.

මෙම නඩත්තු මණ්ඩලය විසින් ලබා දෙන යම් නඩත්තු ගෙවීමක් පිළිබඳ නියෝගයක් යම් දරුවකු විසින් පැහැරහරින අවස්ථාවකදී නඩත්තු පතනේ 32 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයට එම තීරණය බලාත්මක කරවීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට යොමු කිරීමේ හැකියාව පවතී.එහිදී මහේස්ත්‍රාත් වරයෙකුට එම නියෝග නඩත්තු ආඥාපනත යටතේ කරන ලද අඥාවක් ක්‍රියාවේ යොදවන ආකාරයටම ක්‍රියාත්මක කිරීමේ බලය ඇත.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය - 2021

2021 වර්ෂයේ ලැබී ඇති පැමිණිලි	- 65
විසඳුම් ලබා දුන් පැමිණිලි ගණන	- 16
දැනට විභාගවෙමින් පවතින පැමිණිලි	- 49
පැවැත් වූ රැස්වීම් වාර ගණන	- 13
වියදම් වූ මුදල රු.	– 843,420.00

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලයේ සාමාජිකයින්

ඩඩ්ලි අබේසිරි කරුණාරත්න මහතා	සභාපති
එම්.ජී.පුංචි බණ්ඩා මහතා	ලේකම්

මණ්ඩලයේ සාමාජික

1. ආචාර්ය ලීල් ගුණසේකර මයා
2. විශේෂඥ වෛද්‍ය හිලරි කුරේ මහතා
3. ගීතා ද ෆොන්සේකා මිය
4. රම්‍යා සුරියආරච්චි මිය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ - WDV	02	102,968,737.08	98,191,550.40
ජංගම වත්කම්			
ස්ථාවර තැන්පතු	03	2,483,498,750.16	2,019,776,871.21
කාර්ය මණ්ඩල ණය	04	7,273,127.00	6,933,113.00
කාර්ය මණ්ඩල අත්තිකාරම්	05	2,500.00	45,950.00
තොගය	06	1,071,816.90	883,334.76
වෙනත් ලැබිය යුතු දෑ	07	58,779,251.23	43,070,116.52
මුදල් සහ මුදල් සමාන	08	363,508,955.29	406,082,997.50
මුළු ජංගම වත්කම්		**2,914,134,400.58**	**2,476,792,382.99**
මුළු වත්කම්		**3,017,103,137.66**	**2,574,983,933.39**
හිමිකම්			
රජයෙන් දායක වූ ප්‍රාග්ධනය	09	31,320,644.40	38,236,465.22
ප්‍රාග්ධන පරිත්‍යාග	10	78,268,000.00	80,261,400.00
ප්‍රත්‍යාගණන සංචිතය	11	14,203,010.28	324,615.28
සමුච්චිත අතිරික්තය/(හිඟය)	12	(33,754,724.67)	(35,186,151.44)
මුළු හිමිකම්		**90,036,930.01**	**83,636,329.06**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික)	13	32,064,667.50	29,141,217.50
කාර්ය මණ්ඩල ණය අරමුදල	14	-	1,951,624.58
වැඩිහිටි ආරක්ෂක අරමුදල	15	2,888,661,598.14	2,446,938,177.47
වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන	16	12,984.35	26,984.35
මුළු ජංගම නොවන වගකීම්		**2,920,739,249.99**	**2,478,058,003.90**
ජංගම **වගකීම්**			
උපචිත වියදම්	17	644,861.33	9,165,308.20
පොදු තැන්පතු	18	5,406,096.33	3,572,292.23
ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	19	276,000.00	552,000.00
මුළු ජංගම වගකීම්		**6,326,957.66**	**13,289,600.43**
මුළු හිමිකම් සහ වගකීම්		**3,017,103,137.66**	**2,574,983,933.39**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

පිටු 27 සිට 30 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 31 සිට 38 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සභාවේ සාමාජිකයින්ට වගකීම පැවරේ.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ්
රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

සභාපති
වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

කේ.ජී.ලැනරෝල්
අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාල

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම			
රජයෙන් ප්‍රදාන - පුනරාවර්තන	20	166,900,000.00	159,695,000.00
වෙනත් ආදායම්	21	1,027,108.76	424,049.18
විලම්භිත ආදායම	22	9,585,870.82	10,068,682.58
මුළු ආදායම		**177,512,979.58**	**170,187,731.76**
අඩු: වියදම්			
වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්	23	15,568,541.82	33,694,827.10
සේවක පිරිවැය	24	120,449,831.41	115,411,313.50
දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම	25	9,585,870.82	10,721,884.68
ගමන් වියදම්	26	2,835,159.00	2,868,681.00
සැපයුම්	27	2,746,597.17	2,074,562.57
නඩත්තු වියදම්	28	3,292,493.42	5,096,336.23
කොන්ත්‍රාත් සේවා	29	23,698,913.10	11,721,032.85
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම	30	176,650.00	-
පූහුණුව සහ ධාරිතා වර්ධන		-	473,395.00
මුළු වියදම්		**178,354,056.74**	**182,062,032.93**
වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය)		**(841,077.16)**	**(11,874,301.17)**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

විස්තර	ප්‍රාග්ධනය දායකය		ප්‍රාග්ධන පරිත්‍යාග	ප්‍රත්‍යාගණන සංචිතය	සමුච්චිත අතිරික්තය
	ප්‍රාග්ධන අග්‍රිමය	ප්‍රාග්ධන දීමනා			
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**37,135,997.80**	**9,175,750.00**	**82,254,800.00**	**(6,701,884.72)**	**(26,262,035.37)**
පෙර වර්ෂ ගැලපීම	-	-	-	-	(427,500.00)
වර්ෂය තුළ ගැලපීම	(5,110,157.58)	(2,965,125.00)	(1,993,400.00)	7,026,500.00	3,377,685.10
වර්ෂය සඳහා අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	(11,874,301.17)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**32,025,840.22**	**6,210,625.00**	**80,261,400.00**	**324,615.28**	**(35,186,151.44)**
පෙර වර්ෂ ගැලපීම	-	-	-	-	1,951,624.58
වර්ෂය තුළ ගැලපීම	(3,968,195.82)	(2,947,625.00)	(1,993,400.00)	13,878,395.00	320,879.35
වර්ෂය සඳහා අතිරික්තය/ ඌනතාවය	-	-	-	-	(841,077.16)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**28,057,644.40**	**3,263,000.00**	**78,268,000.00**	**14,203,010.28**	**(33,754,724.67)**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 Rs.	2020 Rs.
අතිරික්තය / (ඌනතාවය) බදු ගෙවීමට පෙර	**(841,077.16)**	**(11,874,301.17)**
ගැලපීම්		
විලම්භිත ආදායම	(9,585,870.82)	(10,068,682.58)
දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම	9,585,870.82	10,721,884.68
ප්‍රතිපාදන / (ආපසු හරවන ලද) පාරිතෝෂිකය	3,121,472.50	5,886,467.00
පෙර වර්ෂ ගැලපුම් ගිණුම	1,951,624.58	(427,500.00)
වර්ෂය තුළ ගැලපීම	320,879.35	3,377,685.10
ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම) කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර	**4,552,899.27**	**(2,384,446.97)**
ආයෝජන අඩුවීම (වැඩිවීම)/ (ස්ථාවර තැන්පතු)	(463,721,878.95)	(311,549,804.32)
ඉන්වෙන්ටරි (වැඩිවීම)/ අඩුවීම	(188,482.14)	(264,490.81)
කාර්ය මණ්ඩල ණය (වැඩිවීම)/අඩුවීම	(340,014.00)	(406,914.00)
කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම	43,450.00	34,412.76
අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම	(15,709,134.71)	(2,698,485.06)
ප්‍රතිපාදන සහ අනෙකුත් ගෙවිය යුතු දේවල වැඩිවීම/(අඩුවීම).	(276,000.00)	(465,400.00)
කාර්ය මණ්ඩල ණය අරමුදලේ වැඩිවීම /(අඩු වීම).	(1,951,624.58)	553,606.73
පොදු තැන්පතු වැඩිවීම /(අඩුවීම).	1,833,804.10	1,701,860.32
උපචිත වියදම් වැඩිවීම /(අඩු වීම).	(8,520,446.87)	8,164,398.63
පසුගිය වසරේ අධිභාරය වැඩිවීම /(අඩුවීම).	-	(2,615,078.85)
මෙහෙයුම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**(484,277,427.88)**	**(309,930,341.57)**
පාරිතෝෂික ගෙවීම්	(198,022.50)	(314,220.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම).	**(484,475,450.38)**	**(310,244,561.57)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(484,662.50)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම)	**(484,662.50)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රදානය (ප්‍රාග්ධනය)	676,650.00	-
වැඩිහිටි ආවරණ කැපකරු යෝජනා ක්‍රමය	(14,000.00)	(44,000.00)
වැඩිහිටි ආරක්ෂණ අරමුදල	441,723,420.67	515,192,928.28
ශුද්ධ මුදල් ගලා ඒම / (පිටතට ගලා යාම) මූල්‍ය ක්‍රියාකාරකම්වලින්	**442,386,070.67**	**515,148,928.28**
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ (අඩු වීම)/ වැඩිවීම	(42,574,042.21)	204,904,366.71
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	406,082,997.50	201,178,630.79
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	**363,508,955.29**	**406,082,997.50**
මුදල් සහ මුදල් සමානතා සැසඳීම		
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	**363,508,955.29**	**406,082,997.50**

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. පිහිටුවීම හා නීතිමය තත්ත්වය

2011 අංක 05 දරන පනත මගින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය පිහිටුවන ලද අතර එය විධිමත් ලෙස නීත්‍යානුකූල ආයතනයක් ලෙස පිහිටුවන ලදී. වැඩිහිටියන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය (NSE) ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියර, 2 වන මහලෙහි ඩී කොටසහි පිහිටා ඇත.

1.1. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

වැඩිහිටියන් සඳහා වූ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 ට වැඩි වැඩිහිටි පුද්ගලයින්ගේ සුභසාධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ හා ජාතික මට්ටමේ පරිපාලන රාජ්‍ය ආයතනය වේ.

1.2 පිළියෙල කිරීමේ පදනම

1.2.1 අනුකූලතා ප්‍රකාශනය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ICASL) සහ මුදල් අමාත්‍යාංශය එක්ව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය අංශයේ ආයතන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) සහ 2000 අංක 09 දරණ වැඩිහිටි අයිතිවාසිකම් සුරැකීමේ පනතේ IV වැනි වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා අනුව මෙම ප්‍රකාශන සකස් කර ඇත.

1.2.2 මිනුම් පදනම

විශේෂයෙන් සඳහන් කර නොමැති නම් මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

නුදුරු අනාගතයේ දී එහි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ලේකම් කාර්යාලය සතුව ඇති බව සභාවේ සාමාජිකයින් සෑහීමකට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙනය.

1.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

විශේෂයෙන් සඳහන් නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇත.

(අ) විදේශ මුදල් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. විදේශ මුදල් ගණුදෙණුව පලමුව සටහන් වන්නේ ගනුදෙනුව සිදු වූ දිනයේ පවතින ක්‍රියාකාරී මුදල් අනුපාතිකයටය.

(ආ) දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා හානිකරණ පාඩු අඩුකර ප්‍රකාශ කර ඇත.

පසුකාලීන වියදම්

ප්‍රධාන පරීක්ෂණ සහ ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරන ලද දේපල, පිරියත සහ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනීකරණය කර ඇත. අනෙකුත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපල, පිරියත සහ උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය මත පදනම්ව, වාර්ෂිකව පහත සඳහන් අනුපාත භාවිතා කරමින් සරල මාර්ග ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කෙරේ. මිලදී ගත් වර්ෂය සඳහා තවදුරටත් ක්ෂයවීම් සම්පූර්ණයෙන්ම ගණනය කරන ලද අතර ඉවත් කිරීමේදී ක්ෂයවීම ගණනය කරනු නොලැබේ.

ගොඩනැගිලි	4%
මෝටර් වාහන	10%
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	15%
බලාගාරය, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	20%

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් වන්නේ නම්, එවැනි වෙනස්කම් පිළිබිඹු කිරීමට එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේදී වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර වෙනස්කම් සිදු කරනු ලැබේ.

(ඇ) හානිකරණ

ධාරණ අගය ආපසු ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස් වන විට දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. වත්කම්වල ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම් වත්කම්වල ධාරණ අගය වහාම එහි ආපසු ලබාගත හැකි මුදලට ලියා හැර ඇත.

(ඈ) ආයෝජන

මෙම ආයෝජන ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු වලින් සමන්විත වේ. මෙම ස්ථාවර තැන්පතු පිරිවැයට ගිණුම්ගත කර ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනට උපචිත පොළිය ලැබිය යුතු පොලී ලෙස දැක්වේ.

(ඉ) තොග

තොගය, ලිපිද්‍රව්‍ය තොග සහ කාර්යාල අවශ්‍යතා වලින් සමන්විත වේ. ඒවා පිරිවැයට දක්වා ඇත.

(ඊ) ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නැවත අයකර ගත හැකි අගයකින් ගෙන යනු ලැබේ. ණයගැතියන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ . අයකරගත නොහැකි බව දන්නා ණය ඒවා හඳුනාගත් වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

(උ) මුදල් සහ මුදල් සමාන මුදල්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු වෙනුවෙන්, බැංකුවේ ඇති මුදල්, අතේ ඇති මුදල්, මාස තුනකට අඩු කල්පිරීමක් ඇති බැංකු වල ස්ථාවර තැන්පතු වලින් මුදල් සහ මුදල් සමාන ද්‍රව්‍ය සමන්විත වේ.

(ඌ) වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශය මත ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගන්නා ලද සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ලේකම් කාර්යාලයට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට වගකීම් සඳහා ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇත.

(එ) **සේවක ප්‍රතිලාභ**

අර්ථ දක්වන ලද දායකත්ව සැලසුම්

ලේකම් කාර්යාලයේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර ආයතනය එම සේවකයින්ගේ මූලික වැටුපෙන් හෝ වේතනයෙන් පිළිවෙලින් 12% සහ 3% දායක වේ.

(ඒ) **ආදායම් හඳුනා ගැනීම**

i. ශ්‍රී ලංකා රජයේ දායකත්වය

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන දායකත්වය උපචිත පදනමක් මත පිළිගැනේ. එය ලේකම් කාර්යාලයේ වියදම් පියවීමේ පදනම මත පුනරාවර්තන සහ ප්‍රාග්ධන දීමනා ලෙස වෙන් කර ඇත.

ii. පොලී ආදායම

පොලී ආදායම උපචිත පදනම මත ගණනය කෙරේ.

(ඔ) **ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම**

සේවා පවත්වාගෙන යාම සඳහා හෝ ආයතනයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

02. දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය - 2021				
විස්තරය	ආරම්භක ශේෂය	එකතු කිරීම්/R.Val.	බැහැර කිරීම්/.	අවසාන ශේෂය
ඉඩම්	38,400,000.00	-	-	38,400,000.00
ගොඩනැගිලි	50,880,552.92	-	-	50,880,552.92
වාහන	29,651,250.00	4,675,000.00	(4,850,000.00)	29,476,250.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	14,728,917.08	1,519,016.50	(4,688,892.99)	11,559,040.59
පිරියත සහ යන්ත්‍රෝපකරණ	18,733,223.25	8,169,041.00	(11,430,539.25)	15,471,725.00
	152,393,943.25	**14,363,057.50**	**(20,969,432.24)**	**145,787,568.51**

ක්ෂයවීම් - 2021				
විස්තර	ආරම්භක ශේෂය	දෙපාර්තමේන්තුඅයකිරීම	බැහැර කිරීම	අවසාන ශේෂය
ගොඩනැගිලි	7,926,140.10	2,035,222.12		9,961,362.22
වාහන	18,208,875.00	2,947,625.00	(4,850,000.00)	16,306,500.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	12,501,880.35	1,508,678.70	(4,688,892.99)	9,321,666.06
පිරියත සහ යන්ත්‍රෝපකරණ	15,565,497.40	3,094,345.00	(11,430,539.25)	7,229,303.15
	54,202,392.85	**9,585,870.82**	**(20,969,432.24)**	**42,818,831.43**

පිරිවැය - 2020				
විස්තර	ආරම්භක ශේෂය	එකතු කිරීම්/R.Val.	බැහැර කිරීම/කපාහැරීම	අවසාන ශේෂය
ඉඩම්	38,400,000.00	-	-	38,400,000.00
ගොඩනැගිලි	50,880,552.92	-	-	50,880,552.92
වාහන	25,951,250.00	5,500,000.00	(1,800,000.00)	29,651,250.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	19,756,328.10	74,000.00	(5,101,411.02)	14,728,917.08
පිරියත සහ යන්ත්‍රෝපකරණ	22,356,523.80	1,452,500.00	(5,075,800.55)	18,733,223.25
	157,344,654.82	**7,026,500.00**	**11,977,211.57**	**152,393,943.25**

ක්ෂයවීම් - 2020				
විස්තර	ආරම්භක ශේෂය	දෙපාර්තමේන්තු අයකිරීම	බැහැර කිරීම/ කපාහැරීම	අවසාන ශේෂය
ගොඩනැගිලි	5,890,917.98	2,035,222.12	-	7,926,140.10
වාහන	17,043,750.00	2,965,125.00	(1,800,000.00)	18,208,875.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	15,628,398.46	1,974,892.91	(5,101,411.02)	12,501,880.35
පිරියත සහ යන්ත්‍රෝපකරණ	16,894,653.30	3,746,644.65	(5,075,800.55)	15,565,497.40
	55,457,719.74	**10,721,884.68**	**11,977,211.57**	**54,202,392.85**

03.ස්ථාවර තැන්පතු

බැංකුව	ගිණුම් අංකය	2021	2020
ලංකා බැංකුව	88226543 / 83184804	9,697,329.32	9,734,533.42
ලංකා බැංකුව	87638575 / 85956728	763,564,994.03	720,405,155.97
ලංකා බැංකුව	87695248 / 86015670	342,710,115.58	324,525,706.62
ලංකා බැංකුව	88067250 / 86597211	506,473,741.30	480,841,235.56
ලංකා බැංකුව	87389279	350,000,000.00	-
ලංකා බැංකුව	27835-0 / 24666-1	57,572,045.42	54,264,743.79
මහජන බැංකුව	26953-8 / 25299-3	81,844,315.24	77,617,164.01
මහජන බැංකුව	28999-0 / 26035-0	81,693,094.45	77,567,359.71
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	35786 / 06344	164,893,039.47	156,375,000.00
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	37550 / 08614	125,050,075.35	118,445,972.13
මුළු වටිනාකම		**2,483,498,750.16**	**2,019,776,871.21**

04 .කාර්ය මණ්ඩල ණය

	2021	2020
ආරම්භක ශේෂය	**6,933,113.00**	**6,526,199.00**
වර්ෂය තුළ ණය නිකුත් කර ඇත	2,634,280.00	2,100,000.00
අඩු: වර්ෂය තුළ ලැබුණු වාරික	(2,294,266.00)	(1,693,086.00)
එකතුව (උපලේඛන අංක 01 බලන්න)	**7,273,127.00**	**6,933,113.00**

05 . කාර්ය මණ්ඩල අත්තිකාරම්

	2021	2020
උත්සව අත්තිකාරම්	2,500.00	38,750.00
විශේෂ අත්තිකාරම්	-	7,200.00
එකතුව (උපලේඛන අංක 02 බලන්න)	**2,500.00**	**45,950.00**

06 . ඉන්වෙන්ටරි 06 (උපලේඛන අංක 03 බලන්න)

07 . වෙනත් ලැබිය යුතු

	2021	2020
ලැබිය යුතු පොලී	**58,779,251.23**	**43,070,116.52**

08 . මුදල් සහ මුදල් සමාන දෑ

	2021	2020
A/C අංක 5234881 හි මුදල් ශේෂය	7,572,047.97	12,169,372.50
A/C අංක 9179076 හි මුදල් ශේෂය	90,251.93	146,692.72
A/C අංක 228075 හි මුදල් ශේෂය	355,846,655.39	393,766,932.28
මුළු වටිනාකම	**363,508,955.29**	**406,082,997.50**

09 . රජයෙන් දායක වූ ප්‍රාග්ධනය

	2021	2020
ආරම්භක ශේෂය	**82,330,745.29**	**82,330,745.29**
රජයෙන් ප්‍රදානය - ප්‍රාග්ධනය	676,650.00	-
	83,007,395.29	**82,330,745.29**
අඩු: විලම්භිත ආදායම - 2016	(9,630,951.51)	(9,630,951.51)
අඩු: : විලම්භිත ආදායම - 2017	(8,056,724.59)	(8,056,724.59)
අඩු: : විලම්භිත ආදායම - 2018	(9,320,240.55)	(9,320,240.55)
අඩු: : විලම්භිත ආදායම - 2019	(9,011,080.84)	(9,011,080.84)
අඩු: : විලම්භිත ආදායම - 2020	(8,075,282.58)	(8,075,282.58)
අඩු: : විලම්භිත ආදායම - 2021	(7,592,470.82)	-
අවසන් ශේෂය	**31,320,644.40**	**38,236,465.22**

10 . ප්‍රාග්ධන පරිත්‍යාග

	2021	2020
මල්වතු හිරිපිටිය ඉඩම	4,200,000.00	4,200,000.00
මාරගහලන්ද ඉඩම	13,000,000.00	13,000,000.00
කතරගම ඉඩම	18,000,000.00	18,000,000.00
හාරගම ඉඩම	3,200,000.00	3,200,000.00
මාලිගාතැන්න වැඩිහිටි නිවාසය	16,122,000.00	16,122,000.00
කතරගම වැඩිහිටි නිවාසය	33,713,000.00	33,713,000.00
	88,235,000.00	**88,235,000.00**
අඩු: විලම්භිත **ආදායම**		
2017 වර්ෂය සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2018 වර්ෂය සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2019 වර්ෂය සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2020 වර්ෂය සඳහා	(1,993,400.00)	(1,993,400.00)
2021 වර්ෂය සඳහා	(1,993,400.00)	-
සමස්ත	**78,268,000.00**	**80,261,400.00**

11. ප්‍රත්‍යාගණන සංචිතය

	2021	2020
ආරම්භක ශේෂය	**324,615.28**	**(6,701,884.72)**
නැවත තක්සේරු කිරීම අතිරික්තය/හිඟය	13,878,395.00	7,026,500.00
අවසන් ශේෂය	**14,203,010.28**	**324,615.28**

12 . සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)

	2021	2020
ආරම්භක ශේෂය	(35,186,151.44)	**(26,262,035.37)**
පෙර වසරේ ගැලපීම	1,951,624.58	(427,500.00)
වර්ෂය තුළ ගැලපීම	320,879.35	3,377,658.10
වර්ෂය සඳහා අතිරික්ත/හිඟය	(841,077.16)	(11,874,301.17)
අවසන් ශේෂය	**(33,754,724.67)**	**(35,186,178.44)**

13. සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික)

	2021	2020
ආරම්භක ශේෂය	**29,141,217.50**	**23,568,970.50**
අඩු: විශ්‍රාමික නිලධාරීන්ට ගෙවීම	(198,022.50)	(314,220.00)
වර්ෂය සඳහා ප්‍රතිපාදන	3,121,472.50	5,886,467.00
අවසන් ශේෂය (උපලේඛන අංක 04 බලන්න)	**32,064,667.50**	**29,141,217.50**

14 .කාර්ය මණ්ඩල ණය අරමුදල

	2021	2020
ආරම්භක ශේෂය	**-**	**1,398,017.85**
ආපදා ණය පොලී	-	553,606.73
අවසන් ශේෂය *	**-**	**1,951,624.58**

*** අවසාන ශේෂය රු.**1,951,624.58 **ක් පෙර වර්ෂයේ ගැලපීම ලෙස සමුච්චිත අතිරික්තයට බැර කර ඇත.**

15 . වැඩිහිටි ආරක්ෂණ අරමුදල

	2021	2020
ආරම්භක ශේෂය	**2,446,938,177.47**	**1,931,745,249.19**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබීම්	461,913,099.77	477,200,000.00
ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලී ආදායම	129,656,681.91	164,129,962.18
	3,038,507,959.15	**2,573,075,211.37**
අඩු: වියදම් **(උපලේඛන අංක 05 බලන්න)**	(149,846,361.01)	(126,137,033.90)
අවසන් ශේෂය	**2,888,661,598.14**	**2,446,938,177.47**

16 . වැඩිහිටි ආවරණ කැපකරු වැඩසටහන

	2021	2020
ආරම්භක ශේෂය	**26,984.35**	**70,984.35**
මුළු ලැබීම්	76,000.00	47,000.00
	102,984.35	**117,984.35**
අඩු: ගෙවීම්	(90,000.00)	(91,000.00)
අවසන් ශේෂය	**12,984.35**	**26,984.35**

17 .උපචිත වියදම්

	2021	2020
හඳුනා ගැනීම සහ වරප්‍රසාද සේවා සැපයීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම	3,316.00	-
වඩා හොඳ සේවාවක් සඳහා වැඩිහිටි නිවාස ප්‍රමිතිකරණය, ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය සහ ලියාපදිංචි කිරීම	973.70	-
පරිපාලනය, අධීක්ෂණය සහ ඇගයීම	7,627.00	-
සේවක පිරිවැය	31,779.00	47,410.00
ගමන් වියදම්	435,698.00	361,911.00
සැපයුම්	11,859.00	4,110.00
සේවාවන්	153,608.63	8,751,877.20
එකතුව	**644,861.33**	**9,165,308.20**

18 . පොදු තැන්පතු

	2021	2020
ආරම්භක ශේෂය	**3,572,292.23**	**1,870,431.91**
මුළු ලැබීම්	13,633,667.71	3,878,353.26
	17,205,959.94	**5,748,785.17**
අඩු: ගෙවීම්	(11,799,863.61)	(2,176,492.94)
අවසන් ශේෂය	**5,406,096.33**	**3,572,292.23**

19 . වෙන්කිරීම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

විගණන ගාස්තු	2021	2020
ආරම්භක ශේෂය	**552,000.00**	**1,017,400.00**
අඩු: ගාස්තු ගෙවීම්	(828,000.00)	(552,000.00)
වර්ෂය සඳහා ප්‍රතිපාදන	552,000.00	86,600.00
අවසන් ශේෂය	**276,000.00**	**552,000.00**

20 . රජයෙන් ප්‍රදාන - පුනරාවර්තන

	2021	2020
වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්	16,475,000.00	33,200,000.00
ආයතනික වියදම්	150,425,000.00	126,495,000.00
එකතුව	**166,900,000.00**	**159,695,000.00**

21 . වෙනත් ආදායම්

	2021	2020
ස්ථාවර තැන්පතු සඳහා පොලිය (ගි.අ.- 88226543 / 83184804)	720,899.35	224,332.42
සංචාරක බංගලා ආදායම	5,875.00	145,335.00
කාර්ය මණ්ඩල ණය සඳහා පොලී	283,573.21	-
විශේෂ අත්තිකාරම් පොලී	1,321.20	2,671.76
අපහරණ අයිතම	13,340.00	51,710.00
වාහන භාවිතය සඳහා කුලී	2,100.00	-
එකතුව	**1,027,108.76**	**424,049.18**

22 . විලම්භීත ආදායම

	2021	2020
ගොඩනැගිල්ල සඳහා ක්ෂය වීම	2,035,222.12	2,035,222.12
වාහන සඳහා ක්ෂය වීම	2,947,625.00	2,965,125.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ සඳහා ක්ෂය වීම	1,508,678.70	1,974,892.91
පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා ක්ෂය වීම	3,094,345.00	3,093,442.55
එකතුව	**9,585,870.82**	**10,068,682.58**

23. වැඩිහිටි ප්‍රතිලාභ වැඩසටහන්

	2021	2020
ගම් මට්ටමේ කමිටු පිහිටුවීම	-	928,473.00
පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්	55,541.50	1,237,706.73
හඳුනා ගැනීම සහ වරප්‍රසාද සේවා සැපයීම සඳහා වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීම	448,611.00	1,603,602.12
වැඩිහිටියන් සඳහා වෛද්‍ය ආධාර	32,200.00	5,317,222.00
වඩා හොඳ සේවාවක් සඳහා වැඩිහිටි නිවාස ප්‍රතිසංස්කරණය, ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය සහ ලියාපදිංචි කිරීම	1,340,034.96	2,187,162.72
ස්වයං රැකියා ආධාර	2,743,950.00	11,829,575.00
ජ්‍යෙෂ්ඨ හරසර ක්‍රීඩා අනුග්‍රාහකත්ව වැඩසටහන	-	274,999.00
වැඩිහිටියන් සඳහා නීතිමය පහසුකම් සැපයීම	2,214,166.00	2,107,244.00
පරිපාලනය, අධීක්ෂණය සහ ඇගයීම	6,802,812.50	4,656,438.00
මාධ්‍ය සහ ප්‍රකාශන	939,922.50	1,183,129.97
ජාත්‍යන්තර වැඩිහිටි දිනය	946,303.36	2,316,974.56
වෙනත් වියදම්	45,000.00	52,300.00
එකතුව	**15,568,541.82**	**33,694,827.10**

24 . සේවක පිරිවැය

	2021	2020
වැටුප් සහ වේතන	83,135,143.08	77,396,765.58
අතිකාල සහ නිවාඩු ගෙවීම්	7,578,569.78	947,160.14
වෙනත් දීමනා	1,894,642.46	21,746,539.18
සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය	797,345.08	7,547,505.30
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් දායකත්වය	23,922,658.51	1,886,876.30
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,121,472.50	5,886,467.00
එකතුව	**120,449,831.41**	**115,411,313.50**

25 . දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය වීම

	2021	2020
ගොඩනැගිලි	2,035,222.12	2,035,222.12
වාහන	2,947,625.00	2,965,125.00
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	1,508,678.70	1,974,892.91
පිරියත හා යන්ත්‍රෝපකරණ	3,094,345.00	3,746,644.65
එකතුව	**9,585,870.82**	**10,721,884.68**

26 . ගමන් වියදම්

	2021	2020
දේශීය	2,835,159.00	2,868,681.00
විදේශීය	-	-
එකතුව	**2,835,159.00**	**2,868,681.00**

27 . සැපයුම්

	2021	2020
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	1,444,453.37	755,380.45
ඉන්ධන	1,196,808.80	1,149,430.28
ආහාර සහ නිල ඇඳුම්	20,000.00	20,000.00
වෙනත්	85,335.00	149,751.84
එකතුව	**2,746,597.17**	**2,074,562.57**

28 . නඩත්තු වියදම්

	2021	2020
වාහන	2,498,531.96	4,736,433.23
පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	793,961.46	359,903.00
එකතුව	**3,292,493.42**	**5,096,336.23**

29 . සේවාවන්

	2021	**2020**
ප්‍රවාහන	ප්‍රවාහන	ප්‍රවාහන
තැපැල් හා විදුලි සංදේශ	822,229.03	1,048,434.44
විදුලිය සහ ජලය	1,126,654.67	1,372,197.26
කුලී	20,483,071.60	8,568,416.43
වෙනත්	401,631.80	365,885.72
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	552,000.00	86,600.00
එකතුව	**23,698,913.10**	**11,721,032.85**

30 . ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම

	2021	**2020**
වේයන් නාශක පාංශු ප්‍රතිකාරය - කතරගම සංචාරක බංගලාව	151,650.00	-
මැනුම් සැලැස්ම සකස් කිරීම - මාරගහලන්ද ඉඩම	25,000.00	-
එකතුව	**176,650.00**	**-**

31 . කල්බදු බැඳීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව කල්බදු බැඳීම් නොමැත.

32 . ප්‍රාග්ධන බැඳීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව ප්‍රාග්ධන බැඳීම් නොමැත.

33 . සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නොමැත.

34 . අසම්භාව්‍ය බැරකම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට අනුව **අසම්භාව්‍ය** බැරකම් නොමැත.

35 . මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පසු සිදුවීම් කිසිවක් සිදු නොවීය.

36 . සංසන්දනාත්මක සංඛ්‍යා

ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා අවශ්‍ය තැන්වල සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සඳහන් කර ඇත.

37 . සභා සාමාජිකයින්ගේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සභා සාමාජිකයින්ගේ වගකීම වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්එස්ඩබ්/සී/එන්එස්ඊ/එෆ්එස්/2021

මබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 නොවැම්බර් ෧෧ දින

සභාපති

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට ක්ෂය කර අවසන් වී තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.9,100,000ක් වූ වෑන් රථය පිළිබඳව ශ්‍රී ලංකා රජය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ආවරණය කර නොතිබුණු අතර මෙම රථයේ ඵලදායී ජීවන කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝශය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 විධිවිධාන වලට පටහැනිව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා වැඩිහිටි දීමනාවෙන් අරමුදලේ බැරට ලබාගත යුතු දායක මුදල , මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් අරමුදල ආරම්භ කළ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාලව රු.75,999,300ක් වූ නිහඟිටි දායක මුදල් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඇ) විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල බාහිර පාර්ශවයන්ගෙන් ආධාර, පරිත්‍යාග හා දායක මුදල් රු.253,775ක් ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ආපසු ගෙවන තැන්පතු ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාජ ආරක්ෂණ අරමුදලේ බැංකු ගිණුමට ලැබී තිබුණු රු.48,337,714ක් වූ තැන්පතු මුදලක් හඳුනාගෙන අරමුදල් ශේෂයට ගැලපීමට කටයුතු කර නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අරමුදල් ශේෂය ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඉ) මහලේකම් කාර්යාලයේ කටයුතු සඳහා මහාභාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.මිලියන 7ක භාණ්ඩාගාර ප්‍රදානයන්, ආදායමක් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු නොකිරීම නිසා මහලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. එසේම ඉකුත් වර්ෂවල මහලේකම් කාර්යාලයේ බැංකු ගිණුමට බැරකර තිබුණු රු.7,563,822ක විවිධ ලැබීම්, ආදායම් ලෙස හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ණයගැතියන්ගෙන් ලැබී වර්ෂයකට වැඩි කාලයක සිට උපලබ්ධි නොවුණු චෙක්පත් 19කට අදාල රු.7,283,922ක වටිනාකම් නැවත ණයගැති ශේෂයන්ට ගැලපීමට කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ණයගැති ශේෂය ඉහත ප්‍රමාණයක් අඩුවෙන් දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මහලේකම් කාර්යාලය 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ලේකම් කාර්යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මහලේකම් කාර්යාලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මහලේකම් කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මහලේකම් කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මහලේකම් කාර්යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ.395(ඇ)	බැංකු ජංගම ගිණුම්වල එක් එක් මාසය අවසානයේ දී ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කල යුතු වුවත් එසේ පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් ජංගම ගිණුම් මගින් සිදුකරනු ලබන ගනුදෙනුවල වූ වැරදි හා වංචා හෙළිදරව් කරගැනීමට දීර්ඝ කාලයක් ගතවන බව නිරීක්ෂණය විය.
(ii) මු.රෙ.395(උ)	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුත්තේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම , චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පැවැත්වීම යනාදි මුදල් හා සම්බන්ධ කටයුතු වලට සහභාගී නොවන නිලධාරියෙකු විසින් වුවත් එක් බැංකු ගිණුමකට අදාල බැංකු සැසඳුම් පිළියෙල කිරීමට එම ජංගම ගිණුමේ මුදල් හා සම්බන්ධ කටයුතු කරන නිලධාරියාටම පවරා තිබුණි.
(iii)මු.රෙ.396(ඇ)	කල්ඉකුත් වූ චෙක්පත් අවලංගු කර ගෙවීමට ඇති මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුව තිබුණද රු.509,885ක් වූ චෙක්පත් 33ක වලංගු කාලය මාස 6ක් කල් ඉකුත් වී තිබුණද එසේ කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මහලේකම් කාර්යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) වැඩිහිටියන්ගේ නිදහස , රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගිත්වය, අභිමානය සහතික කිරීම,අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්යයන් උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදකාවකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැඩිහිටියන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය , වයස් ව්‍යුහය, සෞඛ්‍ය තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චිත, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වගන්තියේ විධිවිධාන පරිදි වැඩිහිටි ප්‍රජාවගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළියෙල කිරීමට ප්‍රමාණවත් හා කාර්යක්ෂම ලෙස පියවර ගෙන නොතිබුණි.

(ආ) පනතේ විධිවිධාන පරිදි වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, අභිමානය ආරක්ෂා කිරීම යනාදී ප්‍රධාන කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු වී තිබුණේද යන්න පිළිබඳව ඇගයීම් හා පසුවිපරම් කටයුතු කිරීමට අදාල පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු වී නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මහලේකම් කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට ලබාගෙන තිබුණු දායක මුදල් වලින් වැඩිහිටියන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා උපයෝජනය නොකළ රු.355,846,655ක් හා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී, එක් එක් වර්ෂයන් තුල උපයෝජනය නොකළ රු.7,572,048ක අතිරික්ත මුදලක් බැංකු ජංගම ගිණුමේ රඳවා තිබුණි. එකී අතිරික්ත මුදල් 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 21 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ජාතික සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය ප්‍රවර්ධනය උදෙසා සමාලෝචිත වර්ෂය තුල ශ්‍රවණ උපකරණ 700ක් ලබාදීමට රු.මිලියන 13.5 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද , රු.මිලියන 7.5ක් උපයෝජනය කර උපකරණ 419ක් පමණක් ලබාදී තිබුණි.

(ඇ) අධ්‍යක්ෂවරයාගේ නිල රථය ලෙස භාවිතා කළ ගත් මිල වටිනාකම රු.5,795,000 ක් වූ කාර් රථය , අධ්‍යක්ෂවරයා විසින්ම පැදවීම සිදුකර තිබියදී අනතුරට පත් වී ඉන් රථයේ ඉදිරිපසට සම්පූර්ණ වශයෙන් අලාභ හානී සිදුවී තිබුණි. අනතුර සිදු වී වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද , ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.104(3) පරිදි අනතුර පිළිබඳ විස්තර ඇතුලත් ප්‍රාරම්භක වාර්තාව හෝ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අලාභයේ වටිනාකම නිශ්චිත ලෙස ගණනය කිරීම හා ඊට වගකිව යුතු පාර්ශවයන් සඳහා විනය කටයුතු ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා 2016 වර්ෂයේදී රජයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන මත රු.4,245,807ක් ලබාදී තිබුණු අතර ඉන් රු.2,438,715ක් වැය දරා තිබුණ ද ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි රු.1,807,092ක් වූ මුදල නිශ්කාර්යව පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 05ක පමණ කාලයක් රඳවාගෙන තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) මහලේකම් කාර්යාලයේ කටයුතු ඉටුකිරීමේ අපහසුතාවය හා වාහන නොමැති වීම යනාදී හේතු දක්වා කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයට අයත් අළුත්වැඩියා කෙරෙමින් පැවති මොන්ටෙරෝ වර්ගයේ ජීප් රථයක් , කාර්යාලයේ රාජකාරී සඳහා ධාවනයට ඉල්ලාගෙන , අමාත්‍යාංශයේ ධාවන කාලයේදී සිදුකළ අලුත්වැඩියා වෙනුවෙන් රු. 1,585,521ක් වූ වියදම් අවධිමත් ලෙස මහලේකම් කාර්යාලයෙන් ගෙවීම් කර නිටපු අධ්‍යක්ෂවරයාගේ නිල රථය ලෙස ධාවනයට යොදවා ගෙන තිබුණි. අලුත්වැඩියා වියදමෙන් රු.1,093,823ක් ජාතික සභාවේ අනුමැතියකින් තොරව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලෙන් ගෙවා තිබුණු අතර ඊට ජාතික සභාවේ එකඟතාවය නොලැබීම හේතුවෙන් වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අරමුදලෙන්, වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට රු.1,093,823ක් ආපසු ගෙවීම් කර තිබුණි. එවකට නිටපු අධ්‍යක්ෂවරයා සේවා ස්ථාන මාරු වී යාමෙන් පසු අමාත්‍යාංශය විසින් කළ ඉල්ලීම අනුව 2020 දෙසැම්බර් 10 දින ජීප් රථය අමාත්‍යාංශයට භාර දී තිබුණි. දැරූ අලුත්වැඩියා වියදමට ප්‍රමාණවත් ලෙස ධාවනයට යෙදවීම වෙනුවෙන් ජීප් රථය රඳවාගැනීමට හෝ වැයකළ අලුත්වැඩියා වියදම අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබීම හේතුවෙන් මහලේකම් කාර්යාලයට රු. 1,585,521ක පාඩුවක් සිදුකර තිබුණු අතර වර්ෂ 02කට ආසන්න කාලයක් ඉකුත් වී තිබුණ ද , දැරූ වියදම් පූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) නවෝත්පාදන ප්‍රවේශයන් මත කඩිනම්, කාර්යක්ෂම හා සඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අපේක්ෂිත ප්‍රතිඵල ලභාකර ගැනීම තුලින් ඉලක්කගත ප්‍රජාවගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය, සහභාගීත්වය, අභිමානය සහතික කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සාක්ෂාත් කරගෙන ඇති බව තහවුරු කරගැනීම සහ ඒ සඳහා මූල්‍ය හා මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම හා අනුගමනය කර ඇති ක්‍රමවේද , පිළිවෙත් හා ප්‍රතිපත්ති යනාදියේ නිවැරදි බව තහවුරු කරගැනීමට අදාල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

(ඇ) වැඩිහිටි ආරක්ෂණ අරමුදල ස්ථාපිත කළ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල වැඩිහිටියන්ගේ සුභසාධනය වෙනුවෙන් විවිධ ක්ෂේත්‍ර යටතේ මූලික කාර්යයන් 10 ඉටුකිරීමට ඉලක්කගත කර තිබුණ ද , එකී කාර්යයන් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවතිණි. වැඩිහිටියන් වෙනුවෙන් ස්වයං රැකියා ආධාර ලබාදීම සහ ඒ තුලින් ඔවුන් නිෂ්පාදනය කරනු කරන දෑ අලෙවි කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීම,ජාතික සංවර්ධනයේ කොටස් කරුවන් කිරීම,වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම යනාදී ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ආබාධිත වැඩිහිටියන් 925 දෙනෙකු සඳහා අත්වාරු , වෝකර්, කොමඩ, රෝදපුටු සහ කිහිළිකරු යන ආබාධිත උපකරණ ලබාදීමට රු.මිලියන 10 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද , ආබාධිත උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී පැවති දීර්ඝ කාල ප්‍රමාදයන් හේතුවෙන් එකී ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම අත්හිටුවා 2022 වර්ෂය දක්වා කල්දමා තිබුණි.

(ඉ) වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2016 අගෝස්තු 30 දින ලැබුණ ද , මුදල් රෙගුලාසි 876(2) විධිවිධාන පරිදි ඊට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු පනතක් මඟින් නෛතික භාවයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී 2016 වර්ෂයේ අගෝස්තු සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල රු.මිලියන 2825.20 හා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් හෝ නොමැතිව 2016 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුල රු.මිලියන 308.86 අරමුදලට අයකරගෙන තිබුණි. එසේම අරමුදලට 2016-2018 කාලය තුල රු.1,384.27ක හා 2019-2021කාලය තුල රු.1,441.93ක අරමුදල් රැස්කර තිබුණ ද , අරමුදලේ කාර්යයන් සඳහා ඉහත පළමු වර්ෂ 03 තුල අරමුදල් උපයෝජනය කර නොතිබුණු අතර දෙවන වර්ෂ 03 තුල ද උපයෝජනය කර තිබුණේ රු.මිලියන 573.32ක් පමණකි. එහි වාර්ෂික ප්‍රතිශතය සියයට 59ක් ,සියයට 26ක් හා සියයට 32ක් විය.

(ඊ) වයස අවුරුදු 70 ඉක්ම වූ අඩු ආදායම්ලාභී වැඩිහිටි පුරවැසියන් වෙත මාසිකව රු.2,000ක දීමනාව ගෙවීමට අදාලව දීමනාලාභීන්ගේ විස්තර ඇතුළත් ලේඛනයක් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් දීමනා ගෙවීම පිළිබඳව නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම, අදාල තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පිළිඹයල කිරීම හා එය යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි. තවද ගෙවූ දීමනා පිළිබඳ තොරතුරු ඇතුලත් සාරාංශ වියදම් වාර්තාවක් මසක් අවසාන වී ඊලඟ මාස 30 වන දිනට පෙර ලබා ගැනීමට මහ ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණු අතර දීමනා ගෙවීම පිළිබඳව පසු විපරම් කිරීම සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වන විට දීමනාලාභීන් පිළිබඳ දත්ත රැස් කිරීමේ කටයුතු , වැඩිහිටි විෂය භාර නිලධාරීන් ප්‍රමාණාත්මකව හා කාර්යක්ෂම පරිදි ඉටුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ ද අවධානය යොමු වී නොතිබුණි. වැඩිහිටි දීමනා ගෙවීම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පාලනයක් පවත්වා නොතිබීම හා පසු විපරම් කටයුතු

ඉටුකර නොතිබීම හේතුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ වල 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල රු.476,000ක් වූ මූල්‍ය වංචා සිදු වී තිබුණු බව විගණනයේදී අනාවරණය කරගෙන තිබුණි.

(ඇ) මහලේකම් කාර්යාලය සඳහා ජ්‍යෙෂ්ඨ, තෘතීයික, ද්විතියික සහ ප්‍රාථමික ගණවලට අදාලව කාර්යය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 129ක් වූ අතර, තථ්‍ය කාර්යමණ්ඩලය 117ක් හා පුරප්පාඩු 12ක් විය. අධ්‍යක්ෂ , සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) , සහකාර අධ්‍යක්ෂ (පාලන) , ගණකාධිකාරී, නීති නිලධාරී, සහකාර අධ්‍යක්ෂ (කොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) කොන්ත්‍රාත්, වශයෙන් ජ්‍යෙෂ්ඨ ගණයේ තනතුරු 06ක් හා තෘතීයික සේවා ගණයේ පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩු පැවති අතර වැඩිහිටි මහලේකම් කාර්යාලය 2000 වර්ෂයේ සංස්ථාපනය කළ දින සිට වර්ෂ 21ක් ඉකුත් වී තිබුණද එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ සහ ගණකාධිකාරී තනතුරු 02 සඳහා ද්විතියන පදනම යටතේ හා පරිපාලන නිලධාරී තනතුර සඳහා වැඩ බැලීම සඳහා තාවකාලිකව පත්කිරීම් කර තිබුණි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල විශාල වශයෙන් පුරප්පාඩු පැවතීම මත ආයතනයේ පරිපාලන හා කාර්යය කටයුතු ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පණතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව.

1.4

1.4.1

(i) මුදල් පොතේ ගණුදෙනු සටහන් කිරීම විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු කර ඇත.

(ii) සෑම මාසයක් අවසානයේදීම මුදල් පොත තුලනය කර ඊළඟ මාසයේ ආරම්භක මුදල් ශේෂය ලබා ගැනීමටත්, එහි නිරවද්‍යතාවය සහතික කර ගැනීම සඳහා දෛනිකව මුදල් පොත තුලනය කිරීමටත් කටයුතු කර ඇත.

(iii) මුදල් පොතේ ශේෂය පදනම් කරගෙන බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමට කටයුතු කර ඇත.

(iv) රාජකාරී විධිමත් පරිදි බෙදා හැරීම තුළින් ගිණුම් කටයුතු හා සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත.

1.4.2

(අ) කාර්යාලය සතු මෝටර් රථවල අගය ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇත. එම අගයන් 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

(ආ) සමාජ ආරක්ෂණ අරමුදලේ දායක මුදල් 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල උපචිත පදනම මත ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

1.4.3

(අ) ආධාර, පරිත්‍යාග හා දායක මුදල් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ආ) 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාජ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් වෙනම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කර ඇත.

(ඇ) අරමුදලේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ඈ) ඉඩම්වල අත්පත් කරගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ඉ) මෙම ඉඩමේ අයිතිය පවරාගෙන ඇති අතර ඉඩම සහ එහි දැනට පවතින ගොඩනැගිලිවල වටිනාකම ප්‍රත්‍යාගණනය කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තොරතුරු යොමු කර ඇත.

1.4.4

(අ) බැංකුවට ලැබුණු සෘජු ප්‍රේෂණ සියල්ල හඳුනාගෙන ගිණුම්ගත කර ඇත.

(ආ) බැංකු ගිණුමට බැර කර ඇති සියලුම තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කර ඇත.

(ඇ) උපලබ්ධි නොවූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. අනුව අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

1.5

(ආ)

(i) මුදල් රෙගුලාසිවල සඳහන් වන ආකාරයට නියමිත දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීමට කටයුතු කර ඇත.

(ii) අදාල බැංකු ගිණුම් සම්බන්ධ රාජකාරී කටයුතු සිදු නොකරන නිලධාරීන්ට බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ රාජකාරී පැවරීමට කටයුතු කර ඇත.

(iii) කල් ඉකුත් වූ චෙක්පත් සියල්ල සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන ගිණුම්වල ගැලපීම සිදු කර ඇත.

1.6

(අ) වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ අනුමැතිය යටතේ අරමුදලෙන් වියදම් දැරීමට ප්‍රමාණවත් ශේෂයක් පමණක් රඳවාගෙන අතිරික්ත අරමුදල් ස්ථාවර තැන්පත් ගිණුම්වල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත.

(ආ) මුදල් පොතේ වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමටත් සෘජුව තැන්පත් කරනු ලැබූ තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත් කටයුතු කර ඇත.

3.

3.1

(අ) මේ වනවිට වැඩිහිටි දත්ත පද්ධතිය සකස් කර අවසන් කර ඇත.

(ආ) එවකට රටේ පැවති කොරෝනා වසංගත තත්වය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් රජය ගනු ලැබූ ප්‍රතිපත්ති යටතේ 2021 වර්ෂයේ පසුවිපරම් කටයුතු සිදු කිරීම සීමා කිරීමට සිදු විය.

(ඇ) කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි අධ්‍යක්ෂතුමන් සඳහා නිල රථයක් වෙන් කර ඇති අතර, එම රථය ධාවනය කිරීමේදී අනතුරට පත්විනි. එම රථය අළුත්වැඩියා කිරීමට යොමු කල නමුත් එම අවස්ථාවේදී පැවති අහිතකර ආර්ථික තත්වය මත අමතර කොටස් සපයා ගැනීම දුෂ්කර වූ නමුත් මේ වන විට එම අමතර කොටස් සපයාගෙන ඇති අතර අළුත්වැඩියා කටයුතු අවසන් අදියරේ පවතී. එමෙන්ම අනතුර සම්බන්ධව මු.රෙ 104 පරීක්ෂණයක් සිදුකර ඇත.

(ඈ) 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත 2000 මැයි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ පළ කර ඇත. එම පණත අනුව 19 වන වගන්තිය ප්‍රකාරව IV වන කොටස යටතේ මෙම අරමුදල පිහිටුවා ඇත. ඒ අනුව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලට අදාල පණත පාර්ලිමේන්තුව හා කැබිනට් මණ්ඩලයේ අනුදැනුම ප්‍රකාරව පිහිටුවා ඇත. ඔබගේ නිරීක්ෂණ දෝෂයන්හි සැලකිය යුතු දෝෂයක් අපටද නිරීක්ෂණය වේ. එනම් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1992 යටතේ 876(2) යනුවෙන් වගන්තියක් නිරීක්ෂණය නොවේ. මුදල් රෙගුලාසි සංග්‍රහයේ 424 පිටුවේ සඳහන් වන්නේ අංක 876- 879 මුදල් රෙගුලාසි නිකුත් කර නොමැති බවකි.

3.2

(අ) මේ වනවිට එම ඉලක්කය සම්පූර්ණ කර ඇත.

(ආ) මෙම ස්වයං රැකියා ආධාර ලබා දීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්වය නංවාලීම සඳහා දැනටමත් කටයුතු කර ඇති අතර ස්වයං රැකියා ආධාර ලබාදීමේ වැඩසටහන මේ වනවිට සාර්ථක ලෙස ක්‍රියාත්මක කරමින් පවතී.

(ඇ) 2020/2021 වර්ෂ තුළදී බදුල්ල, නුවරඑළිය යන දිස්ත්‍රික්ක වලින් පමණක් රු.2000/- දිමනාලාභීන්ගේ තොරතුරු ඇතුළත් වාර්තා මේ වනතෙක් ලැබී නොමැත. බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවල ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් තොරතුරු ලබා දීමේ ප්‍රමාදය මත වාර්තා ලබා ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව එම දිස්ත්‍රික් මගින් තොරතුරු ලබා ගැනීමට කටයුතු කර බව කාරුණිකව දන්වමි. 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පණත මගින් වැඩිහිටි මේ වනවිට සමෘද්ධි දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වැඩිහිටි දීමනාලාභීන් සම්බන්ධව තොරතුරු පද්ධතිය සකස් කර අවසන් කොට ඇත. මහරගම හා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුවී ඇති මුල්‍ය වංචාව පිළිබඳව විගණනය විසින් දැනුවත් කළ පසු අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.

(ඈ)

(i) දිස්ත්‍රික්ක මට්ටමින් සියලු වැඩිහිටි නිවාසවල පාලක පාලිකාවන් පුහුණු කරමින් සිටින අතර NAITA ආයතනය සමඟ ඉදිරියේදී මෙම කටයුත්ත ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී.

(ii) ප්‍රතිලාභීන් ඉදිරිපත් කරන ඉල්ලීම් අනුව සුවපහසු මූල්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ නමුත් වසංගත තත්වය හමුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ට පහසුකම් අවශ්‍ය වැඩිහිටි ප්‍රජාව පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට නොහැකි තත්වයක් උද්ගත විය. කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රටේ ඇඳිරිනීතිය පනවා රට වසා තැබීම නිසා තැපැල් කටයුතු ද ප්‍රමාද වීම හේතුවෙන් මාස 08 ක් ඉකුත් වී ගිය පසු මුදල් නිදහස් කිරීමට සිදු විය.

(iii) ස්වයං රැකියා ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. 2022 වර්ෂයේ සිට ජාතික සභා අනුමැතිය මත වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලැබෙන ඉල්ලීම් අනුව කටයුතු කර ඇත.

(ඉ) 2022 වර්ෂය තුල වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා සුබසාධනය වෙනුවෙන් බොහෝ වැඩසටහන් සිදු කර ඇති අතර 2021 වර්ෂයේ 55.3 % ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

3.3 මතභේදයට තුඩු දෙන කරුණු

ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ පැවති සංචිත වාහන ප්‍රමාණවත් නොවීම මත එවකට සිටි අධ්‍යක්ෂතුමන්ගේ නිල රථය ලෙස භාවිත කිරීම සඳහා මෙම රථය රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පරිදි ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට ලබා ගෙන තිබුණි. එම අධ්‍යක්ෂතුමන්ගේ සේවා කාලය අවසන් වීමත් සමග ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස සමාජ සේවා අධ්‍යක්ෂ කටයුතු කිරීමේදී එතුමාගේ නිල රථය ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් රථයක් භාවිතා කරන ලදී. එම තත්වය තුල මෙම මොන්ටෙරෝ රථය ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ සංචිත වාහන වලට ගනු ලැබූ අතර, පසුව කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශයට වාහනය නැවත බාර දුනි.

3.4 අරමුදල් ඌණ උපයෝජනය

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් අදියරේ පැවතිය ද එය නැවත කාලානුරූපීව සංශෝධනයන්ට ලක්කල යුතු බවට සහ සකස් කරන ලද උපාය මාර්ගික සැලැස්මට අනුගත කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. මේ සම්බන්ධව මේ වනවිට කෙටුම්පත් සකස් කර ඇත.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

දිවියට සවියක් වැඩසටහන යටතේ අබාධිත උපකරණ ලබා දීමේ වැඩසටහන සඳහා ජාතික සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ක්‍රමවේදයට අනුව සිදු කරන ලදී. එවකට රටතුළ කොරෝනා වසංගත තත්වය උග්‍ර ලෙස පැවතීම නිසා සේවකයින් සේවයට කැඳවීම සීමා කර තිබීමත් යම් යම් අවස්ථාවන්හි රට වසා තැබීම නිසාත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කාල ප්‍රමාදයක් සිදු වූ අතර රුපියලට සාපේක්ෂව ඩොලරයේ අගය සිඝ්‍ර ලෙස ඉහළ යාමත්, ආනයනික භාණ්ඩ ගෙන්වීම සීමා කිරීම හේතුවෙන් අදාල සැපයුම් ආයතනය අදාල උපකරණ ලබා දීමට නොහැකි බව දැනුම් දීමත් සමඟ ඒ පිළිබඳ සොයා බලා ජාතික සභාවේ අනුමැතිය පරිදි අදාල උපකරණ මිළදී ගැනීම නතර කරන ලදී

3.6 මානව සම්පත් කළමනාකරණය

(අ)

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙනුවෙන් 2009.10.22 දින කාර්යය මණ්ඩලය පළමුවරට අනුමත කර තිබුණද, අදාල තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටිය අනුමත කර තිබුනේ 2011.01.28 දින වේ. අනෙකුත් තනතුරු සඳහා පිළිවෙලින් පහත පරිදි තනතුරු අනුමැතිය ලැබී ඇත. සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුර පූර්ණ කාලීන තනතුරක් ලෙස අනුමත කර ඇත්තේ 2020.07.22 වන දින වේ. තවද නීති නිලධාරි තනතුරට අදාල සංශෝධනයන් සිදු විය යුතුව තිබූ බැවින් සංශෝධන සහිතව අනුමත කිරීම සිදු කර ඇත්තේ 2021.01.29 වන දින වේ. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර) තනතුර 2017.01.31 වන දින අනුමත කර ඇත. එදින සිට මේ දක්වාම අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු සඳහා ද්විතීයන පදනම මත හෝ වැඩ බැලීමේ පදනම මත හෝ රාජකාරි ආවරණය කිරීමේ පදනම මත වරින් වර රේඛීය අමාත්‍යාංශය විසින් පත් කිරීම් සිදු කර ඇත. පරිපාලන නිලධාරි තනතුර අනුමත කර ඇත්තේ 2009.10.22 දින වන අතර, ඊට අදාල බඳවාගැනීම් පරිපාටිය 2011.01.28 වන දින අනුමත කර තිබුණි. එදින සිට අදාල තනතුරේ රාජකාරි සඳහා ද්විතීයන පදනම මත කළමනාකරණ සේවයේ අධි පන්තියේ උසස්වීම් ලද නිලධාරීන් අවස්ථා 02 දී පත්වීම් ලබා පැමිණි අතර, අවසානයේ පරිපාලන නිලධාරි තනතුරෙහි රාජකාරි සිදු කරන ලද නිලධාරිනිය ස්ථාන මාරුවී යාමත් සමඟ ඇතිවූ පුරප්පාඩුව සඳහා ආයතනයේ රාජකාරි පිළිබඳ මනා දැනුමක් හා පළපුරුද්දක් සහිත නිලධාරිනියක වන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරිනියක් වැඩ බැලීම සඳහා පත් කරන ලදී. පරිපාලන නිලධාරි තනතුර සඳහා පළපුරුදු මෙන්ම සුදුසුකම් සහිත නිලධාරියෙකු බඳවාගත යුතු අතර, ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමේදී පළපුරුද්දක් හා අත්දැකීම් සහිත ආයතනයේ කාර්යයන් හා ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් ඇති නිලධාරීන් මෙවැනි ආයතන වෙත ඍජුවම යොමුවීමේ අඩු ප්‍රවණතාවයක් පවති. ඒ අනුව නිලධාරියෙකු ස්ථිරව බඳවා ගැනීමට කටයුතු නොකල අතර අදාල පුරප්පාඩුව වෙනුවෙන් කාලෝචිත මෙන්ම සුදුසු පියවරක් ලෙස ජාතික සභාවේ අනුමැතිය ද ලබාගෙන වැඩ බැලීමට අදාල පත්කිරීම සිදු කර ඇත. 2020.10.26 දිනැති අංක 02/2020 චක්‍රලේඛය මගින් බඳවා ගැනීම් සීමා කිරීම හේතුවෙන් අදාල බඳවා ගැනීම් සිදු කිරීම සඳහා කටයුතු නොකරන ලද අතර, නව බඳවා ගැනීම් සඳහා රජයේ අවසරය ලද පසු එම තනතුරු වෙත කඩිනමින් බඳවා ගනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. එතෙක් ආයතනයේ රාජකාරි කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට සුදුසු පියවර ගෙන කටයුතු කර ඇත.

(ආ)

(i) 09/2009 චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂයේ ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිළදීගෙන භාවිතය සඳහා කටයුතු කර ඇත. වසර ගණනාවක් භාවිත කිරීමත් සමග අලුත්වැඩියාවන් සිදුකල නොහැකි මට්ටමෙන් ඇඟිලි සළකුණු යන්ත්‍රය 2020 වර්ෂයේ අග භාගයේදී අක්‍රියවීම සිදුවිය. 2019 වර්ෂයේ 02 වන කාර්තුවේ සිට ලොව පුරා ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් නිලධාරීන් ආයතනය වෙත කැඳවීම් තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධයෙන් රජය විසින් කටයුතු කර තිබුනි. තවද එතැන් සිට වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛයන්හි පැමිණිම හා පිටවීම සම්බන්ධයෙන් නොසලකා හැර රාජකාරි සිදු කරන ලෙස ද නිවසේ සිට රාජකාරි සිදු කරන ලෙස ද දැනුම් දී තිබුණි. එමෙන්ම එහි උපදෙස් පරිදි අත්‍යවශ්‍ය අවම නිලධාරීන් සංඛ්‍යාවකින් කාර්යාල කටයුතු පැවැත්වීම සඳහා ක්‍රියාකරන ලදී. 2022.01.03 වන දින සිට රාජ්‍ය නිලධාරීන් සාමාන්‍ය පරිදි සේවයට කැඳවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව නිලධාරීන්ගේ පැමිණිම හා පිටවීම නිසි පරිදි ගණනය කිරීම ආරම්භ කරන ලදි. නව ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදී ගැනීම 2022 වර්ෂයේ දෙවන කාර්තුවේදී සිදු කරන ලද අතර මේ වනවිට නියමිත පරිදි කටයුතු කරනු ලැබේ.

(ii) නිලධාරීන්ගේ සේවා අංකය හා අත්සන යොදා පැමිණීමේ ලේඛණය ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කිරීමක් පසුගිය වසරේ සිදුකර නොතිබූ අතර සාමාන්‍ය පරිදි නිලධාරීන් කැඳවීම ආරම්භ කරන ලද 2022.01.03 දින සිට මේ මේ සඳහා කටයුතු කර ඇත. තවද තම සේවා අංකය යොදා අත්සන් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීමද සිදු කර ඇති අතර පැමිණීමේ ලේඛණයේ ඉදිරිපස නිලධාරියාගේ නම හා නව සේවා අංකයද අත්සන ද යොදා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු ද සිදු කර ඇති අතර 2023 වර්ෂයේ පැමිණීමේ ලේඛණයේ මෙම අඩුපාඩු නිවැරදි කිරීම සිදු කර ඇත.


(iii) එම වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කරන ලෙස රජය විසින් රාජ්‍ය නිලධාරීන් දිරිගන්වා තිබුණු හෙයින් එම කාල පරිච්ඡේදය තුළ සේවකයන් නියමිත පරිදි රාජකාරි සඳහා නොකැඳවීම හේතුවෙන් පැමිණීමේ ලේඛණය වැසිම සඳහා කටයුතු කිරීමේ නොහැකියාවක් තිබිනි. ඒ හේතුවෙන් ඇඟිලි සළකුණු යන්ත්‍රය ද භාවිත නොකරන ලදී.නමුත් මේ වනවිට එම කටයුත්ත යථා පරිදි සිදු කරනු ලබයි.

(iv) පැමිණීමේ ලේඛණය අනුව නිලධාරීන්ගේ දෛනික පැමිණීම, පිටවීම මෙන්ම බැහැර ලේඛණය අනුව බැහැර යාම්ද රාජකාරි නිවාඩු ලබා ගැනීම්ද එක් එක් නිලධාරියා සඳහා මාසිකව වෙන්වෙන්ව සටහන් ගොණුවක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ සියලු තොරතුරු ගොණුවෙහි ඇතුළත් කර ඇත. එම තොරතුරු සම්බන්ධයෙන් දිනපතා පැමිණීම් පිටවීම්, රාජකාරි නිවාඩු, බැහැර යාම් මෙන්ම නිවාඩු ලබා ගැනීම් ද ඇතුලත් කර මාසයකට එක් සටහනක් බැගින් වසරකට අදාල වන ලෙස දිනපතා යාවත්කාලීන කර ඇත. ඒ අනුව නිවාඩු ලේඛණය යාවත්කාලීන කිරීම සිදුකර පරීක්ෂා කර අනුමත කිරීම සිදුකර ඇත.

04

4.1 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

මේ වනවිට සිදුවූ අතපසුවීම් අවම කර ගනිමින් අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණවත් ලෙසට සිදු කරමින් පවතී.



කේ.ජී.ලැනරෝල්
අධ්‍යක්ෂ